218 වන කාණ්ඩය - 4 වන කලාපය
தொகுதி 218 - இல. 4
**Volume 218 - No. 4**

2013 ජූලි 12 වන සිකුරාදා
2013 யூலை 12, வெள்ளிக்கிழமை
**Friday, 12th July, 2013**

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වරප්‍රසාද යෝජනා:**

2013 ජූනි 6 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් විකාශය කරන ලද වැඩසටහන

**අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදි

**කල්තැබීමේ යෝජනාව:**

ආපදා කළමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

அரசியலமைப்புக்கான இருபத்தோராவது திருத்தம்: உயர்நீதிமன்றத் தீர்ப்பு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

2013 யூன் 6ஆந் திகதி இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம் ஒலிபரப்பிய நிகழ்ச்சி

**அபிமானி சமூக அபிவிருத்தி மற்றும் கலாசார மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**

இரண்டாம்முறை மதிப்பிடப்பட்டு நிலைக்குழு 'ஏ' க்கு சாட்டப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

அனர்த்த முகாமைத்துவ ஆற்றலை மேம்படுத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Twenty First Amendment to the Constitution: Determination of the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

PRIVILEGE MOTIONS:

Programme aired by Sri Lanka Broadcasting Corporation on 6th June 2013

ABHIMANI SOCIAL DEVELOPMENT AND CULTURAL FOUNDATION (INCORPORATION) BILL:

Read a Second time, and allocated to Standing Committee "A"

ADJOURNMENT MOTION:

Enhancement of Disaster Management Capacity

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2013 ජූලි මස 12 වන සිකුරාදා***
*2013 ஜூலை 12, வெள்ளிக்கிழமை*
*Friday, 12h July, 2013*

***අ.භා. 1.30ට පාර්ලිමේන්තුව රැස් විය.***
***නියෝජ්‍ය කථානායකතුමා [ ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் பி.ப. 1.30 மணிக்குக் கூடியது.*
*பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.30 p.m.,*
MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### විසිඑක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### அரசியலமைப்புக்கான இருபத்தோராவது திருத்தம் : உயர் நீதிமன்றத் தீர்ப்பு
### TWENTY FIRST AMENDMENT TO THE CONSTITUTION : DETERMINATION OF THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

I wish to announce to the House that I have received the Determination of the Supreme Court in respect of the Bill titled "Twenty First Amendment to the Constitution" which has been challenged in the Supreme Court in terms of Article 121(1) of the Constitution.

The Court has determined that in terms of Article 123 of the Constitution, the Petition filed by the Petitioner is misconceived in law and premised on a footing in contravention of the jurisdiction conferred on the Court by proviso (a) to Article 120 read with Article 124 of the Constitution.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's Proceedings.

***ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :***
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

**IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA**

**In the matter of an Application under Article 121(1) of the Constitution**

**SC SD No 17/2013**

**Before:** Mohan Pieris, PC, Chief Justice
Chandra Ekanayake, J.
Sathyaa Hettige, PC J.

**Counsel:**
Viran Corea with Suren Fernando and Luwie Ganeshanathan for Petitioner
Manohara de Silva PC with P P Gunasena and Avinda Wickremanayake for Intervenient-Petitioner Ven. Athureliya Rathna Thero -
Priyantha Jayawardene PC with Lakshman Thirimanne and Vimanga Perera for the Intervenient-Petitioner E.V.P.Rasanga Harischandra
Priyantha Jayawardene PC with Lakshman Thirimanne and Vimanga Perera for the Intervenient-Petitioner, Dr. Vijitha Nanayakkara
Indika Demuni de Silva, DSG with Dr Avanthi Perera SC and Suren Gnanaraj SC for the Attorney General

Court assembled for hearing at 10.00 a.m on 1st July 2013.

A Bill titled "Twenty First Amendment To The Constitution" has been presented to Parliament as a Private Member's Bill. The Bill was placed on the Order paper of Parliament on 18th June 2013 and the Petitioner has invoked the constitutional jurisdiction of this Court vested in it by virtue of Article 120 of the Constitution by presenting papers dated 24th June 2013 and due notice of the petition that has been filed was given to the Hon. Attorney General.

The Bill in its long title is described as a Bill to amend the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

The Private Member's Bill in its preamble narrates in several paragraphs its version of the genesis and passage of the 13th Amendment to the Constitution and the consequent need to amend the Constitution. The Amending Clauses which are enumerated at Clauses 2 and 3 of the Bill read as follows.

**Clause 2**

*The Constitution of the Democratic Socialist Republic of Sri Lanka (hereinafter referred to as the "Constitution") is hereby amended by the repeal of-*

*(a) Article154A to 154T which constitute chapter XVIIA*
*(b) Article 155 (3A)*
*(c) Ninth Schedule*

**Clause 3**

*Article 170 of the Constitution is hereby amended by the substitution in the definition of "written law" for the words "and includes statutes made by Provincial Councils, orders" of the words "and include orders".*

Whilst the Bill purports to repeal Article154A to 154T which constitute chapter XVIIA, Article 155 (3A) and the Ninth Schedule, it also seeks to amend Article 170 of the Constitution in order to remove the reference therein to statutes made by Provincial Councils.

**Grounds of Challenge**

The two principal grounds of challenge that have been set out in the petition dated 24.06.2013 pertain to what would be called pre-enactment procedures and the jurisdiction of the Supreme Court has been invoked in terms of Article 121 read with Article 120, Article 78 and Article 154G(2) of the Constitution praying for the following two determinations to be made -

(a) a *determination* that the Bill titled the "The Twenty First Amendment to the Constitution (Private Member's Bill) has not been validly placed on the Order Paper of Parliament and cannot be enacted into law

(b) a *determination* that the Bill titled the "The Twenty First Amendment to the Constitution (Private Member's Bill) can only be placed on the Order Paper of Parliament after such Bill has been referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council of the expression of its views thereon, within such period as may be specified in the reference, and shall not become law unless there is due compliance with Article 154G(2) of the Constitution, including the requirement that such Bill is duly referred to every Provincial Council in terms of Article 154G(2) of the Constitution.

At the hearing before this Court, the Petitioner adumbrated his main submissions as follows-

(a) The Supreme Court has the sole and exclusive jurisdiction to inquire into or pronounce upon the procedural compliance of a Bill before it is placed on the Order Paper Parliament.

(b) The Bill is not in law a valid Bill, since the mandatory requirements laid down in Article 154G(2) of the Constitution have not been adhered to prior to it being placed on the Order Paper of Parliament, namely, that in terms of Article 154G(2) of the Constitution, the Bill must be referred by H.E the President to every Provincial Council for the expression of views, prior to the Bill being capable of being lawfully placed on the Order Paper of Parliament;

(c) Therefore, the Supreme Court would not consider the question of whether a Referendum was required, as set out in the proviso (a) to Article 120 of the Constitution, as there is no "valid and proper Bill" before Parliament.

The Petitioner claimed that the provisions of Articles 154G(2) and 154G(3) of the Constitution are couched in identical and mandatory language, and thus, the principles set forth in previous determinations of this Court are applicable *mutatis mutandis* to the Bill in question.

In support of his submissions, the Petitioner cited the determinations in the Water Services Reform Bill –SC (SD) No 24-25/2003, Local Authorities (Special Provisions) Bill –SC (SD) No 6/2008 and No 7/2008, Town and Planning (Amendment) Bill-SC (SD) No 3/2011 and Divineguma Bill-SC (SD) No 1/2012 and No 3/2012.

The Counsel for the Petitioner also submitted that the provisions of Article 154G(2) are *sui generis* and have to be treated differently.

At the very outset, this Court wishes to make the observation that the aforesaid determinations deal with Government Bills which were placed on the Order Paper of Parliament for enactment. Further they were ordinary Bills and not ones seeking to amend, repeal or replace the Constitution.

In this backdrop it would be appropriate to take cognizance of the parameters of the Constitutional jurisdiction of the Supreme Court in regard to Bills and it is condign to bear in mind, in the consideration of the grounds of challenge, the constitutional prescriptions as particularly set out in proviso (a) to Article 120 of the Constitution.

**Article 120 proviso (a)**

The Constitutional jurisdiction of the Supreme Court is set out in Article 120 of the Constitution as follows-

*The Supreme Court shall have sole and exclusive jurisdiction to determine any question as to whether any bill or any provision thereof is inconsistent with the Constitution.*

The exercise of the sole and exclusive jurisdiction of the Supreme Court to determine any question as to whether any Bill or any provision thereof is inconsistent with the Constitution is itself circumscribed in four provisos-namely subparagraphs (a), (b), (c)and (d).

The Proviso (a) to Article 120 that is material to the Bill under consideration reads thus-

*in the case of a Bill described in its long title as being for the amendment of any provision of the Constitution, or for the repeal and replacement of the Constitution,* ***the only question which the Supreme Court may determine is whether such Bill requires approval by the People at a Referendum by virtue of the provisions of Article 83;***

The other provisos (b), (c) and (d) to Article 120 of the Constitution refer to bills with a certificate thereon by the Cabinet of Ministers and thus they would have no application in the consideration of a Private Member's Bill.

The proviso (a) to Article 120 of the Constitution which pertains to a Bill for the amendment of any provision of the Constitution or for the repeal and replacement of the Constitution has been commented upon by this Court in a number of determinations which in unison lay down that in view of Article 120 (a) of the Constitution, the only question which this Court has to *determine* is whether the Bill requires the approval of the people at referendum by virtue of the provisions of Article 83. It is apposite to refer to some of those determinations.

In SC No 4 of 1978, five judges of this Court made the following determination in respect of the **"First Amendment to the Constitution Bill."**

*"The Bill in its long title is described as being for the amendment of the Constitution.* ***In view of Article 120(a) of the Constitution, the only question which this Court has to determine is whether this Bill requires the approval by the People at a Referendum by virtue of the provisions of Article 83."***

The same view was expressed in SC 3 of 1979-**Second Amendment to the Constitution**, SC 2/82 –**Third Amendment to the Constitution**, SC 1 of 1983-the **Fifth Amendment to the Constitution** and **SC Special Determination No 8/2000**. In fact in the Determination on the Bill entitled **"Seventeenth Amendment to the Constitution",** the Supreme Court echoed an identical view as follows-

*"The Bill is described in its long title as being an Act for the amendment of the Constitution. The provisions to be repealed, altered or added have been expressly specified in the Bill, as noted above...... The Bill will not become law unless it is passed by the special majority provided for in Article 82 (5) of the Constitution.*

***Therefore in effect the only matter for determination by this Court is whether in addition to being passed by the special majority it should be approved by the People at a Referendum as required by Article 83 of the Constitution........"***

*Stricto sensu* the determination that this Court is empowered to make has to fall within the pale of the Constitutional prescriptions. Be that as it may, juxtaposed viz a viz the above, what is sought as determinations in this challenge are two in number-namely

(a) the Bill has not been validly placed on the order paper Parliament and cannot be enacted into law;

(c) the bill can only be placed on the order paper Parliament after such Bill has been referred by President, after its publication in the Gazette and before it is placed on the order paper Parliament, to every Provincial Council of the expression of its views thereon, within such period as may be specified in the reference, and shall not become law unless there is due compliance with Article 154G(2) of the Constitution, including the requirement that such Bill is duly referred to every Provincial Council in terms of Article 154G(2) of the Constitution.

This Court observes that these two determinations are barred by the express conferment of jurisdiction in proviso (a) to Article 120 to make the determination only on one question namely whether the Bill requires approval by the People at a Referendum by the provisions of Article 83. This Court holds that Article 120 (a) of the Constitution would preclude this Court from making these two determinations as the Constitution has not conferred this Court with the requisite jurisdiction.

It is a basic tenet of law that a court must be clothed with jurisdiction as any assumption of jurisdiction would render a decision devoid of legal effect and null and void. It is to be noted that the jurisdictional remit of the Supreme Court as stipulated in Article 120 of the Constitution has not been enlarged and the Court is constrained to hold fast to the bounds of its jurisdiction assigned to it by the grundnorm-the Supreme Law of the nation.

There are several factors that fortify this position.

The petitioner in its prayer for the first determination requires this Court to hold that the impugned Bill has not been validly placed on the order paper of Parliament. Other than the proscription in proviso (a) to Article 120, there is a cogent argument as to why this Court would desist from making that determination.

The court takes the view that the placement of the Bill on the Order Paper is part of the proceedings of Parliament that took place on 18th June 2013 and this Court is denuded of jurisdiction to impeach proceedings in Parliament. This position is reflected in Section 3 of the Parliamentary (Powers and Privileges) Act which states-

*There shall be freedom of speech, debate and proceedings in Parliament and such freedom of speech, debate or proceedings shall not be liable to be impeached or questioned in any court or place out of Parliament.*

This prohibition against impeachment of Parliamentary proceedings has been elevated as a Constitutional ouster in Article 67 of the Constitution and thus the placement of the impugned Bill on the Order Paper of Parliament falls outside the pale of this Court's scrutiny.

Thus this Court is of the opinion that both Articles 120 and 67 of the Constitution debar this Court from making the first determination.

The gravamen of the complaint of the petitioner is that the first determination that this Court has decided is incapable of being made because of the contention stated above, is coupled to the second determination that the petitioner wants this Court to make namely the Provincial Councils must be consulted in terms of Article 154G (2) of the Constitution before the Bill for the amendment or repeal of the provisions of Chapter XVI or Ninth Schedule is placed on the Order Paper of Parliament.

In other words the Petitioner impugns the failure to follow a pre-enactment procedure and as outlined above the jurisdiction to make the determination that a failure to follow a pre-enactment procedure renders the placement of a Bill on the Order Paper of Parliament invalid, when the intendment of the Bill is to amend any provision of the Constitution or to repeal and replace the Constitution, has not been expressly conferred on the Supreme court in Article 120 of the Constitution. Nor has the additional jurisdiction to make a determination that a Bill cannot be placed on the Order Paper unless there has been due compliance with Article 154G(2) of the Constitution been bestowed on this Court.

The Court wishes to make the observation that the contention advanced by the Counsel for the Petitioner that the provisions of Article 154G(2) stand on a different footing goes counter to the reasoning we have adopted above in regard to the express conferment of jurisdiction vested in this Court in Article 120(a) of the Constitution. When proviso (a) to Article 120 conferred the Supreme Court with jurisdiction to determine (in relation to Bills amending, repealing or replacing the Constitution) only the question of whether such Bill requires to be passed by the People at a Referendum, it is crystal clear that the Constitution excluded all other questions in relation to the Constitutional Jurisdiction on Bills. In the circumstances, the Court takes the view that the proviso (a) to Article 120 of the Constitution enacts an exclusionary rule which on the canon of interpretation namely, express provisions exclude things omitted – warrants a narrow interpretation of proviso (a) to Article 120. Thus the provisions of 154G(2) would stand *pari materia* with other provisions of the Constitution.

**Article 124 of the Constitution**

We take the view that Article 124 of the Constitution also throws light on the grounds of challenge alleged before us. Article 124 of the Constitution states as follows-

*Save as otherwise provided in Articles 120, 121 and 122, no court or tribunal created and established for the administration of justice, or other institution, person or body of persons shall in relation to any Bill, have power or jurisdiction to inquire into, or pronounce upon, the constitutionality of such Bill or.* ***its due compliance with the legislative process, on any ground whatsoever.***

The Article makes it patently clear that the Supreme Court exercises its jurisdiction in regard to Bills only to the extent as is assigned to it in terms of Articles 120, 121 and 122. If jurisdiction to inquire into or pronounce upon the constitutionality of a Bill or its due compliance with the legislative process bestowed with the Supreme Court or any Court for that matter, the constitutionality of the Bill or its due compliance with the legislative process cannot be pronounced upon on any ground whatsoever.

It cannot be gainsaid that consultation with the Provincial Councils as stipulated in Article 154G of the Constitution impinges on legislative process and as long as the jurisdiction to pronounce upon the presence or absence of that process is absent from Article 120, Article 124 makes it crystal clear that this Court is hamstrung from embarking on a scrutiny of that legislative process.

Thus the determinations relied upon by the Petitioner such as Water Services Reform Bill –SC (SD) No 24/2003, Local Authorities (Special Provisions) Bill – SC (SD) No 6/2008 and No 7/2008, Town and Planning (Amendment) Bill-SC (SD) No 3/2011 and Divineguma Bill-SC (SD) No 1/2012 and No 3/2012 are distinguishable in that the Court in those determinations has not grappled with this cardinal ouster as prescribed in proviso (a) to Article 120 and Article 124.

In any event the Court also observes that in those determinations the impugned Bills were not amendments to the Constitution nor were they Bills to repeal and replace the Constitution as their long titles made out. Thus the aforesaid determinations cited before us do not enlarge the circumscribed jurisdiction as reserved to this Court as far as Bills for amendment of any provision of the Constitution or for the repeal and replacement of the Constitution and as such we hold that the Court cannot grant the determinations that Petitioner prays for in its petition.

Thus, this Court takes the view that the Petition filed by the Petitioner is misconceived in law and premised on a footing in contravention of the jurisdiction conferred on this Court by proviso (a) to Article 120 read with Article 124 of the Constitution.

**Mohan Pieris, PC**
**Chief Justice**

**Chandra Ekanayake**
**Judge of the Supreme Court**

**Sathyaa Hettige, PC**
**Judge of the Supreme Court**

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2012 දෙසැම්බර් 8 දිනැති අංක 1787/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2013 පෙබරවාරි 8 දිනැති අංක 1796/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(iii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2013 මැයි 3 දිනැති අංක 1808/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව 2013 ජුනි 7 දිනැති අංක 1813/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය;

(v) (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව (2013 ජුනි 20 දිනැති අංක 1815/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය); සහ

(vi) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු, 1988 අංක 83 දරන පනතින් සංශෝධිත (235 වැනි අධිකාරය වන) රේගු ආඥා පනතේ 10 අ වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ආනයන භාණ්ඩ තීරු බදු සම්බන්ධයෙන් සාදන ලදුව 2013 ජුනි 20 දිනැති අංක 1815/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝගය.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ වාර්ෂික වාර්තාව;

(ii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(iii) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්;

(iv) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම්;

(v) 2010 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(vi) 2010 සහ 2011 වර්ෂ සඳහා මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ සයවැනි සහ සත්වැනි වාර්ෂික වාර්තා;

(vii) 2011 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වාර්ෂික වාර්තාව; සහ

(viii) 2011 වර්ෂය සඳහා ජෛව රසායන, අණුක ජෛව වේද හා ජෛවතාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2012 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍ය ගරු බෂීර් සෙගු ඩාවුඩ් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Reginold Cooray -Minister of Minor Export Crop Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පානදුර, මහවිල, 132/6 දරන ස්ථානයෙහි පදිංචි ඩී.පී. සෝමසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) යගිරල, කනත්ත වත්ත, අංක 59 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එල්. කරුණාතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ 08, ඇල්විටිගල මාවත, ඇල්විටිගල මහල් නිවාස, අංක F/3/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.බී.එස්. බොරළුගොඩ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නැගෙනහිර පළාතේ ග්‍රාම නිලධාරි කොට්ඨාස : පුරප්පාඩු
### கிழக்கு மாகாண கிராம உத்தியோகத்தர் பிரிவுகள்: வெற்றிடங்கள்
### GRAMA NILADHARI DIVISIONS IN EASTERN PROVINCE : VACANCIES

2582/'12

1. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නැගෙනහිර පළාතේ ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ග්‍රාම නිලධාරි කොට්ඨාසවලින් ග්‍රාම නිලධාරින් නොමැති කොට්ඨාස සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීමට අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද;

(v) එම ක්‍රියා පටිපාටිය තුළ නිරවද්‍ය අන්දමින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்திலுள்ள கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி கிராம உத்தியோகத்தர் பிரிவுகளில், கிராம உத்தியோகத்தர்கள் இல்லாத பிரிவுகளின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(iii) குறித்த வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென் பதையும்;

(iv) கிராம உத்தியோகத்தர் வெற்றிடங்களை நிரப்புவதற்காக கடைப்பிடிக்கப்படும் செயல் நடைமுறை யாதென்பதையும்;

(v) மேற்படி செயல் நடைமுறையினூடாக தவறு களற்ற விதத்தில் மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he inform this House -

(i) of the number of Grama Niladhari Divisions in the Eastern Province;

(ii) separately, of the number of Divisions where there are vacancies for Grama Niladharis out of the Grama Niladhari Divisions in each of the district in the aforesaid province;

(iii) of the date on which action will be taken to fill the aforesaid vacancies;

(iv) of the procedure to be adopted to fill the Grama Niladhari vacancies; and

(v) whether action will be taken to fill the aforesaid vacancies properly by following the above-mentioned procedure?

(b) If not, why?

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1,078යි.

(ii)

| | දිස්ත්‍රික්කය | ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව | 2013.05.04 දිනට පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | මඩකලපුව | 345 | 90 |
| 2 | අම්පාර | 503 | 195 |
| 3 | ත්‍රිකුණාමලය | 230 | 70 |
| එකතුව | | 1,078 | 355 |

(iii) දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා 2012.10.05 දිනැති ගැසට් නිවේදනය අනුව අයදුම්පත් කැඳවා 2013.05.04වන දින විවෘත තරග විභාගයක් පවත්වා ඇත. එම තරග විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලද පසු සුදුසුකම් ලබන අපේක්ෂකයන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට කටයුතු කෙරේ.

(iv) දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා ගැසට් නිවේදනයක් මඟින් ඉල්ලුම් පත් කැඳවා එම අපේක්ෂකයන් විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන විවෘත තරග විභාගයකට යොමු කර ඇත. එම තරග විභාගයේ ප්‍රතිඵල මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගනු ලබන අපේක්ෂකයන් මාස

[ගරු විජය දහනායක මහතා]

තුනක පුහුණු පාඨමාලාවකට යොමු කර එය සාර්ථකව නිම කරන අයට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව ග්‍රාම නිලධාරි පත්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි.

ඔබතුමා දන්නවා, ග්‍රාම නිලධාරින් කියන්නේ බහුකාර්ය නිලධාරින් බව. සතියකට එක දවසක් හැරුණු කොට 24 පැයේම පාහේ ඒ අය ජනතා සේවයට කැප වෙලායි ඉන්නේ. අනෙක් සේවා එක්ක සැසඳුවාම ඒ අයට ලැබෙන්නේ අඩු වැටුපක්. ඒ වාගේම ප්‍රමාණවත් ගමන් වියදම් දීමනා ලැබෙන්නේ නැහැ. කොට්ඨාසයේ ඇවිදීමේ කටයුතු වෙනුවෙන් මාසයකට දෙන්නේ රුපියල් 350යි. සංයුක්ත දීමනාව රුපියල් 750යි. 2009 දී මේ අයගේ සේවා ව්‍යවස්ථාවක් ස්ථාපනය කළා. ඒ සේවා ව්‍යවස්ථාව ස්ථාපනය කිරීම තුළින් 1994, 1996, 2000, 2001 වර්ෂවල බඳවා ගත් ග්‍රාම නිලධාරින්, සේවා කාලය නොසලකා එක වැටුපකට අන්තර්ග්‍රහණය කරලා තිබෙනවා. ඒ කියන්නේ, එම්එන් 1-II වන ශ්‍රේණියට බඳවා ගෙන, එම්එන් 2-III වන ශ්‍රේණියේ සිටින විධියට කටයුතු සලස්වා තිබෙනවා. මේ නිසා අවුරුදු 10ක සේවා කාලයක් නොසලකා හැර තිබෙනවා. මේ වාගේ තත්ත්වයක් තුළ ග්‍රාම නිලධාරි සේවාවට යොමු වන පිරිස එන්න එන්නම අඩු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ විෂමතාව නිවැරැදි කරන්න ඔබතුමන්ලා ගන්න පියවර මොකක්ද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ග්‍රාම නිලධාරි සේවය සම්බන්ධව අප කවුරුත් සතුටට පත් වෙනවා කියලා මම හිතනවා. ඒ අය විශාල කාර්ය භාරයක් කරන නිලධාරින් පිරිසක්. අපේ ගරු මන්ත්‍රීතුමා කියන ආකාරයට, වැටුප් සම්බන්ධව යම් ගැටලුවක් තිබෙනවා නම් ඒ ගැන සොයා බලා ගත යුතු පියවරක් තිබෙනවා නම් ඒ පියවර ගන්න පුළුවන්.

මා සූදානම් වෙලා ආවේ නැහැ, ඒ ගොල්ලන්ගේ වැටුප් තලය සහ කාලය සම්බන්ධයෙන් තිබෙන විෂමතාව පිළිබඳව උත්තර දෙන්න, ගරු මන්ත්‍රීතුමනි. නමුත් මා කියනවා, එහෙම අසාධාරණයක් වෙන්න ඉඩ තබන්නේ නැහැයි කියලා. මා හිතන හැටියට මේ වන කොට ග්‍රාම නිලධාරි සේවයේ නියුතු සියලුම නිලධාරි මහත්වරු බොහොම සතුටින් වැඩ කටයුතු කර ගෙන යනවා ඇති. නමුත් යම් යම් අය බලාපොරොත්තු වනවා ඇති, ඊට වඩා ඉහළ වැටුපක් ලැබෙනවා නම් හොඳයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ නිලධාරින්ට අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන අවස්ථාවකදී සාධාරණයක් ඉෂ්ට කරන්න අවශ්‍ය පියවරක් ගන්න පුළුවන්.

ඒ එක්කම මා ඔබතුමාට කියනවා, උපදේශක කාරක සභාවට ඇවිල්ලා ඔබතුමාගේ මේ අදහස් ඉදිරිපත් කරන්න කියලා. එතකොට යම් අලුත් අදහසක් තිබෙනවා නම් අමාත්‍යාංශය හැටියට ඉහළ නිලධාරින්ට ඒ සඳහා අවශ්‍ය පියවරක් ගන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම ස්තුතියි, පිළිතුරු ලබා දීම ගැන. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි.

දැන් ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් වුණා, නැගෙනහිර පළාතේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 1,078ක් තිබෙනවාය කියලා. එහෙම නේද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එයින් පුරප්පාඩු 355ක් තිබෙනවා. කොට්ඨාස 355ක් පුරප්පාඩුව තිබෙන කොට, අනික් කොට්ඨාසවල සේවය කරන ග්‍රාම නිලධාරිතුමන්ලාට සිදු වනවා, වෙනත් කොට්ඨාස වැඩ ආවරණය කරන්න. කොට්ඨාස වැඩ ආවරණය කිරීමේදී, ආවරණය කිරීමේ දීමනාව වශයෙන් 1994 වර්ෂයට පෙර ලබා දුන්නේ ඒ ග්‍රාම නිලධාරිතුමාගේ හෝ නිලධාරිතුමියගේ මූලික වැටුපෙන් හරි අඩක්. නමුත් අද වන විට ඒ වැඩ ආවරණය කිරීම වෙනුවෙන් ලබා දෙන්නේ ග්‍රාම නිලධාරි IIIවන ශ්‍රේණියේ ආරම්භක වැටුපෙන් කාලක්. මෙය බරපතළ අසාධාරණයක් හැටියට මා දකිනවා.

1994 වනතුරු මූලික වැටුපෙන් භාගයක් ලබා දීලා ඉන් පසුව III ශ්‍රේණියේ වැටුපෙන් කාලක වැටුපක් පමණක් ඒ වැඩ ආවරණය කිරීම වෙනුවෙන් ලබා දීමේ අසාධාරණය ඉවත් කරන්නට ඔබතුමන්ලා කටයුතු කරන්නේ කවදා ද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිව දන්නවා, විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙන නිසා ඒ ග්‍රාම නිලධාරි මහත්වරුන් එක වසමක් නොවෙයි, සමහරවිට වසම් දෙකක, තුනක වැඩ බලන බව. එම නිසා මෙහි යම් ගැටලුවක් තිබෙන බව අප දකිනවා. එම නිසා තමයි, බඳවා ගැනීම් ඉක්මන් කර තිබෙන්නේ. ඉතාමත් කෙටි කාලයක් තුළදී මේ අලුත් බඳවා ගැනීම් කරන්නට පුළුවන් වේය කියා මා හිතනවා. ඔබතුමා කියන ආකාරයට ඒ ගෙවීම් සම්බන්ධව යම් ගැටලුවක් තිබෙනවා නම්, ඒ සඳහා ගන්නට පුළුවන් අවශ්‍ය පියවර ගන්නට පුළුවන්කම තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ග්‍රාම නිලධාරිතුමන්ලා බොහොම ආසාවෙන් උනන්දුවෙන් බොහොම ආත්ම තෘප්තියකින් කටයුතු කරනවාය කියා ඔබතුමාගේ පිළිතුරේ සඳහන් කළා. මා ඒකට එකඟ වෙන්නේ නැහැ. මා එකඟ නොවීමත් සමඟ මා ඔබතුමාට ඒ අතෘප්තිමත් භාවයට හේතුවන අඩුපාඩුවක් පෙන්වා දෙන්නට කැමතියි. ඔබතුමන්ලා ඒ නිලධාරින්ට නිල ඇඳුම් දීමනාවක් ලබා දෙනවා නේ. නිල ඇඳුම් දීමනාව වශයෙන් රුපියල් 4,000ක් ලබා දෙනවා, උඩුකයේ නිරුවත ආවරණය කර ගන්න. එතකොට යට කයේ නිරුවත ආවරණය කර ගන්නට දීමනාවක් දෙන්නේ නැහැ. වෙනම ම චක්‍රලේඛයක් හරහා වසරකට රුපියල් 4,000ක් ලබා දෙනවා.

උඩු කය වාගේම යට කයත් ආවරණය කරන්නට වෙනම ම දීමනාවක් ලබා දෙන්නට කටයුතු කරනවා ද? ඒ තුළින් ඒ අය තෘප්තිමත්භාවයක් ලබාවිය කියා මා විශ්වාස කරනවා. [බාධා කිරීම්] ඔබතුමා උත්තරය දෙන්න.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම මේ ඔබතුමාට ඉදිරිපත් කළේ සත්‍ය තොරතුරුයි. අසත්‍ය තොරතුරු නොවෙයි.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
මේ වන විට ලිපි ද්‍රව්‍ය සැපයීම ඇතුළු අනිකුත් සියලුම පහසුකම් වැඩි කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කිව්ව දේ හරි නේද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
දැන් තිබෙන වැටුප වුණත් බලන්න. රාජ්‍ය සේවකයන් හැටියට ඒ ඕනෑම කෙනෙක් බලාපොරොත්තු වෙනවා දිගින් දිගටම ඒ පහසුකම් ලැබෙයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඇහුවේ උඩුකයේ නිරුවතයි-

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමනි, අනිකුත් දීමනා සම්බන්ධව කිව්වොත්, දැනට දෙන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ලැබුණොත් ඔවුන් සතුටු වෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
( பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ෂර්ට් එකට විතරයි දීමනාව දෙන්නේ. කලිසමට ඒ දීමනාව දෙන්නේ නැහැ. ඒකයි කාරණය.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම අඩුවක් තිබෙනවා නම් ඒ ගැන හොයා බලලා අප ඉදිරියේදී ඒ ගැන ක්‍රියා කරන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම ඇත්තක් කිව්වේ. අසත්‍යයක් නොවෙයි.

## මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය - 2010 : වැය කළ මුදල

## இரத்தினக்கல் மற்றும் ஆபரணக் கண்காட்சி - 2010 : செலவிட்ட பணம்

GEM AND JEWELLERY EXHIBITION - 2010 : COST INCURRED

2806/'12

3. **ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2010 වර්ෂයේ දී මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනය පවත්වන ලද දිනය කවරේද;
(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;
(iii) එම ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණ කවරේද;
(iv) එය පවත්වනු ලැබූ ආයතනය හෝ පුද්ගලයින් කවරේද;
(v) ඒ සඳහා මුදල් වියදම් කළ ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රදර්ශනය පැවැත්වීමෙන් ලැබූ ලාභය හෝ අලාභය කවරේද;
(ii) එම ප්‍රදර්ශනයේදී මූල්‍ය වංචාවක් සිදු වී තිබේද;
(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல், புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2010ஆம் ஆண்டில் நடைபெற்ற `இரத்தினக்கல் மற்றும் ஆபரணக் கண்காட்சி,
(i) நடத்தப்பட்ட திகதி யாதென்பதையும்;
(ii) அதற்கென செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு என்பதையும்;
(iii) நடத்தப்பட்டதன் நோக்கம் யாதென்பதையும்;
(iv) நடத்திய நிறுவனங்கள் அல்லது நபர்கள் யாவர் என்பதையும்;
(v) அதற்கென பணத்தைச் செலவிட்ட விதம் யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்கூறிய கண்காட்சி நடத்தப்பட்டதால் பெற்ற இலாபம் அல்லது நட்டம் யாதென்பதையும்;
(ii) குறித்த கண்காட்சியில் நிதி மோசடி இடம்பெற்றுள்ளதா என்பதையும்;
(iii) அவ்வாறாயின், அது தொடர்பில் இன்றளவில் எடுத்துள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

( இ) இன்றேல், ஏன்?

[ගරු දයාසිරි ජයසේකර මහතා]

asked the Minister of Environment and Renewable Energy:

(a) Will he state -

(i) the date on which the "Gem and Jewellery" exhibition in the year 2010 was held;

(ii) the total cost incurred for that exhibition;

(iii) the objective of holding it;

(iv) the names of the institutions or persons who conducted the exhibition; and

(v) the manner in which expenses were borne for the exhibition?

(b) Will he inform this House -

(i) the profit earned or loss incurred by holding the aforesaid exhibition;

(ii) whether a financial fraud has occurred in this exhibition; and

(iii) if so, of the steps taken in this regard by now?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 2010 වර්ෂයේදී මැණික් සහ ස්වර්ණාභාරණ ප්‍රදර්ශනය දෙසැම්බර් මස 10,11 සහ 12 යන දිනයන්හි බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී.

(ii) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ප්‍රදර්ශනය සඳහා රුපියල් මිලියන 32.5ක මුදලක් වැය කර ඇත.

(iii) එම ප්‍රදර්ශනය පැවැත්වීමේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ හමු වන මැණික් හා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන ස්වර්ණාභරණ පිළිබඳව ලාංකික ප්‍රජාව සහ ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමයි. මෙම ප්‍රදර්ශනය හුදෙක් මැණික් සහ ස්වර්ණාභරණ අලෙවිය සඳහා වූ ප්‍රදර්ශනයකට වඩා ශ්‍රී ලංකාවේ හමුවන වර්ග 70ක් පමණ වූ මැණික් වර්ග පිළිබඳව ශ්‍රී ලාංකික ජනතාව දැනුවත් කිරීමත්, මැණික් සහ ස්වර්ණාභාරණ ක්ෂේත්‍රය පිළිබඳව ඇල්මක් දක්වන පුද්ගලයන් දැනුවත් කිරීමත්, අවශ්‍ය ආයතනයන්ට යොමු කිරීමත් මේ තුළින් අපේක්ෂා කෙරිණි.

(iv) මෙම ප්‍රදර්ශනය ශ්‍රී ලංකා රත්න විද්‍යාඥයින්ගේ සංගමයේ සහයෝගීත්වයෙන් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය විසින් සංවිධානය කරන ලදී.

(v) ඒ සඳහා පහත සඳහන් පරිදි මුදල් වියදම් කර ඇත.

| | | |
|---|---|---|
| ප්‍රදර්ශන සංවිධායක ආයතනය | රු. | 23,883,149.20 |
| ප්‍රවර්ධන වියදම් | රු. | 3,866,460,23 |
| ප්‍රදර්ශන ශාලා ගාස්තු | රු. | 2,392,094.33 |
| ආරක්ෂක වියදම් | රු. | 230,550.00 |
| ත්‍යාග ප්‍රදාන උත්සවය වෙනුවෙන් දරන ලද වියදම් | රු. | 150,000.00 |
| හෝර්ඩින්ග්ස් | රු. | 2,070,795.00 |
| **මුළු වියදම** | **රු.** | **32,593,048.76** |

(ආ) (i) ඉහත ප්‍රදර්ශනය සංවිධානය කිරීම තුළින් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය ලාභයක් අපේක්ෂා නොකළ අතර මුළු වියදම රුපියල් මිලියන 32.5ක් විය. ආදායම වශයෙන් රුපියල් මිලියන 5.8ක් ලැබී තිබුණි. මෙම ප්‍රදර්ශනය ලාභයක් ඉපයීම පරමාර්ථ කර ගෙන ඇරඹුවක් නොවූ අතර කර්මාන්තය ප්‍රවර්ධනයට ඉවු කරන ලද කාර්යයකි.

(ii) 2010 විගණන වාර්තාවේ මිලදී ගැනීම් මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකළ අවස්ථා කිහිපයක් පිළිබඳව කරුණු අනාවරණය කර ඇති අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය වංචාවක් සිදු වූ බවට දක්වා නොමැත.

(iii) ඉහත (ii) අනුව අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවන අතුරු ප්‍රශ්නය අහනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වැය කර තිබෙන රුපියල් මිලියන 23ත් ප්‍රදර්ශනය සංවිධානයට. ඒ කියන්නේ මේ ප්‍රදර්ශනය සංවිධානය කරන්න මොකක් හෝ ආයතනයකට දෙන්න ඇති නේ ඇමතිතුමා? ඒකට නේ එච්චර ප්‍රමාණයක් වැය වෙලා තිබෙන්නේ. මොකක්ද ඒ ආයතනය?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ආයතන කීපයක් සමඟ තමයි මෙය සංවිධානය කර තිබෙන්නේ. ඒ වියදම් විගණකාධිපතිවරයාද පරීක්ෂණයට ලක් කරලා ඒ වියදම් පිළිබඳ ගැටලුවක් නැති බව ප්‍රකාශ කරලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

විවිධ පුවත් පත්වල මේ සිද්ධිය ගැන දිගින් දිගටම පළ වුණා, විශාල වංචාවක් සිද්ධ වෙලා තිබෙනවායි කියලා. ඒ සම්බන්ධයෙන් මේ ආයතනයේ එවකට සිටි සභාපති අනිල් කොස්වත්ත මහතාට විරුද්ධවත් විශාල චෝදනා වගයක් තිබුණා. ඔබතුමා මේ ප්‍රකාශය කරන්නේ එතුමා මේකට සම්බන්ධ නැහැ, වරදකාරයෙක් නොවෙයි කියලාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකක්ද චෝදනාව?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
විවිධ චෝදනා ගණනාවක් තිබුණා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පත්තරවල නානා ප්‍රකාර ඒවා පළ කරනවා. ඒක පුවත් පත් නිදහසක්. ඒක විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාත් මේ ගරු සභා ගර්භයේ කියලා තිබෙනවා. පත්තරවල පළ වන හැම දේම ඇත්ත නොවෙයි. ඒ නිදහස. ඔබතුමා අහන පුවත් පතේ පළ වුණු වැරැද්ද මොකක්ද? ඒ වැරැද්ද අහවල් දේ කියලා අහනවා නම් -

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම අහන්නේ ඔබතුමන්ලා එහෙම පරීක්ෂණයක් කරලා තිබෙනවාද කියලායි. එතුමා නිවැරදියි කියලාද කියන්නේ කියලායි මම අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පරීක්ෂණයක් කළා. විගණකාධිපතිවරයාගේ විගණන පරීක්ෂණය සිදු වෙලා, ඒ වාර්තාව තිබෙනවා. ඒ වාර්තාව අනුව මෙහි වැරැද්දක්, වංචාවක් සිදු වී නොමැති බව සඳහන් වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම ඇහුවේ ඒකයි. බොරුවට දඟලන්න ඕනෑ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 4-2886/'12-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් දීම සඳහා මා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 5-2998/'12-(1), ගරු රෝසි සේනානායක මහත්මිය.

**ගරු රෝසි සේනානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஸி சேனாநாயக்க)
(The Hon. (Mrs.) Rosy Senanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6-3046/'12-(2), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## උතුරු පළාතේ ග්‍රාම නිලධාරීන් : පුරප්පාඩු
### வட மாகாண கிராம உத்தியோகத்தர் பிரிவுகள்: வெற்றிடங்கள்
### GRAMA NILADARIS IN NORTHERN PROVINCE: VACANCIES

2583/'12

**10. ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) උතුරු පළාතේ ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් ග්‍රාම නිලධාරීන් නොමැති කොට්ඨාස සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

(iii) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීමට අනුගමනය කරන ක්‍රියා පටිපාටිය කවරේද;

(v) එම ක්‍රියා පටිපාටිය තුළ නිරවද්‍ය අන්දමින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வட மாகாணத்திலுள்ள கிராம உத்தியோகத்தர் பிரிவுகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி கிராம உத்தியோகத்தர் பிரிவுகளில் கிராம உத்தியோகத்தர்கள் இல்லாத பிரிவுகளின் எண்ணிக்கை மாவட்ட வாரியாக வெவ்வேறாக யாதென்பதையும்;

(iii) குறித்த வெற்றிடங்களை நிரப்புவதற்கு நடவடிக்கை எடுக்கப்படும் திகதி யாதென்பதையும்;

(iv) கிராம உத்தியோகத்தர் வெற்றிடங்களைப் பூர்த்திசெய்ய கடைப்பிடிக்கப்படும் நடைமுறை யாதென்பதையும்;

(v) மேற்படி நடைமுறையினூடாக தவறுகளற்ற விதத்தில் குறித்த வெற்றிடங்களைப் பூர்த்திசெய்ய நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he inform this House -

(i) the number of Grama Niladari Divisions in the Northern Province;

(ii) separately, of the number of Divisions where there are vacancies for Grama Niladaris out of the Grama Niladari Divisions in each of the districts in the aforesaid province;

(iii) the date on which action will be taken to fill the aforesaid vacancies;

(iv) the procedure to be adopted to fill the Grama Niladari vacancies; and

(v) whether action will be taken to fill the aforesaid vacancies properly by following the above-mentioned procedure?

(b) If not, why?

**ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) 920

(ii)

| | දිස්ත්‍රික්කය | ග්‍රාම නිලධාරි කොට්ඨාස සංඛ්‍යාව | 2013.05.04 දිනට පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | යාපනය | 435 | 140 |
| 2 | මන්නාරම | 153 | 40 |
| 3 | මුලතිව් | 135 | 44 |
| 4 | කිලිනොච්චි | 95 | 40 |
| 5 | වව්නියා | 102 | 30 |
| එකතුව | | 920 | 294 |

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කීයෙන්ද?

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
920න්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
920න් කීයද ගණන?

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)
පුරප්පාඩු 294යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි.

**ගරු විජය දහනායක මහතා**
(மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

(iii) දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා 2012.10. 05 දිනැති ගැසට් නිවේදනය අනුව අයදුම් පත් කැඳවා 2013.05.04 වන දින විවෘත තරග විභාගයක් පවත්වා ඇත. එම තරග විභාගයේ ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලද පසු සුදුසුකම් ලබන අපේක්ෂකයින් සම්මුඛ

පරීක්ෂණයට කැඳවා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට කටයුතු කෙරේ.

(iv) දිවයින පුරා පවතින ග්‍රාම නිලධාරි පුරප්පාඩු පිරවීම සඳහා ගැසට් නිවේදනයක් මඟින් අයදුම් පත් කැඳවා එම අපේක්ෂකයින් විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වන විවෘත තරග විභාගයකට යොමු කර ඇත. එම තරග විභාගයේ ප්‍රතිඵල මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගනු ලබන අපේක්ෂකයින් මාස තුනක පුහුණු පාඨමාලාවකට යොමු කර එය සාර්ථකව නිම කරන අයට ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව ග්‍රාම නිලධාරි පත් වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(v) ඔව්.

(ආ) අදාළ නොවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමු වන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා උතුරු පළාතේ ග්‍රාම නිලධාරි කොට්ඨාස 920න් 294ක පුරප්පාඩු තිබෙනවාය කියා. ලංකාවේම තිබෙන ග්‍රාම නිලධාරි කොට්ඨාස 14,000න් 4000කට වැඩි ප්‍රමාණයක පුරප්පාඩු තිබෙනවා.

ග්‍රාම නිලධාරිතුමන්ලාට පරිණත වූ ජනතා සේවාවක් ඉෂ්ට කරන්නට තීරු බදු රහිතව, ණය සහන ක්‍රමයට, අඩු පොලියට යතුරු පැදි ලබා දීමට ඔබතුමන්ලා පොරොන්දු වෙලා තිබෙනවා. මේ පුරප්පාඩු පිරවීමත් සමඟ ග්‍රාම නිලධාරිතුමන්ලාට තීරු බදු රහිතව, අඩු පොලියට, සහන ණය ක්‍රමයක් යටතේ ඒ යතුරු පැදි ලබා දෙන්නට කටයුතු කරන්නේ කවදා ද කියලා මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි. දැන් ඔය උතුරු වසන්තයක් තිබෙනවාලු, නැඟෙනහිර නවෝදයක් තිබෙනවාලු. ඒවා හරහා කවදාද මේවා ක්‍රියාත්මක කරන්නේ? මොකද, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාටයි, පළාත් සභා මන්ත්‍රීතුමන්ලාටයි තීරු බදු රහිත වාහන ලබා දෙන්නට මැළි වීමක් නැති කාල වකවානුවක ග්‍රාම නිලධාරිතුමන්ලාගේ ඉල්ලීම ඉෂ්ට කරන්නේ කවදා ද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමනි, ග්‍රාම නිලධාරි මහත්වරුන්ට මේ කාර්යය හොඳින් කරගෙන යන්න අද රට පුරාම සේවා පියසවල් ඉදි කිරීම දැන් ආරම්භ කර තිබෙනවා. ඒ එක්කම ඉදිරියේදී ලැප්ටොප් පරිගණක සියලු දෙනාටම ලබා දීලා මේ සියල්ලම සම්බන්ධ කරලා ඔවුන්ගේ සේවාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න අමාත්‍යාංශය කටයුතු කරගෙන යනවා. අවශ්‍ය විධියට කාර්යාලීය උපකරණ සියල්ලමත් ලබා දෙන්න කටයුතු සූදානම් කර තිබෙනවා. ඉතින් අපි විශ්වාස කරනවා, වෙනදාට වැඩිය ග්‍රාම නිලධාරි මහත්වරුන්ට තමන්ගේ සේවාව, කාර්යය පහසුවෙන් කරගෙන යන්න පුළුවන් කියලා. අපි බලාපොරොත්තු වනවා, තව තවත් පහසුකම්, සේවාවන් දෙන්න. මොකද, විශේෂ අවස්ථාවලදී මේ ග්‍රාම නිලධාරි මහත්වරු විශාල කාර්ය භාරයක් කරනවා අපි දකිනවා. අද සංවර්ධන කටයුතුවලදීත් ඒ එක්කම ඒ බලප්‍රදේශවල අනෙකුත් කටයුතුවලදීත් වෙහෙස වෙන මේ නිලධාරීන් වෙනුවෙන් අමාත්‍යාංශය හැටියට ඉදිරියේදී දෙන්න පුළුවන් උපරිම පහසුකම් ලබා දෙන්න අවශ්‍ය කටයුතු කරනවා කියලා මා ඔබතුමාට කියනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ග්‍රාම නිලධාරිතුමන්ලාගේ සේවා පහසුව උදෙසා විවිධ උපකරණ, ආම්පන්න ලබා දීමක් කෙරෙනවාය කියා ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

කාර්යාලීය උපකරණ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඡන්ද නාම ලේඛන ප්‍රතිශෝධනයට ලක් කරන මොහොතක රජයේ ඇමතිවරයෙක් ගිහින් කඩුවෙල බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිතුමන්ලාට ජංගම දුරකථන සහ ගමන් මලු බෙදා දීමක් සිදු වෙලා තිබෙනවා. ඔබතුමා ඒක අනුමත කරනවාද?

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පෞද්ගලික මතය අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

නැහැ. මම අහන්නේ ඔබතුමා ඒක අනුමත කරනවාද කියලායි.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

යම් යම් සේවාවන් කර ගෙන යන විට ගරු මන්ත්‍රීතුමනි, කොළඹ දිස්ත්‍රික්කයේත් මේ අවට බල ප්‍රදේශවලත් විශාල ජනගහනයක් වෙසෙනවා. නිවාස නොමැති අය තෝරා ගැනීම, ණය ලබා දීම ඇතුළු අනෙකුත් කාර්ය භාරයන්වලදී ග්‍රාම නිලධාරිතුමන්ලා විශාල වැඩ කොටසක් කරනවා. යම් අමාත්‍යාංශයක් ඒ වෙනුවෙන් යම් පහසුකමක් දෙන්න සූදානම් කර තිබෙනවා නම් ඒ සම්බන්ධව අමාත්‍යාංශය හැටියට අපි කිසිසේත් මැළි වන්නේ නැහැ. ග්‍රාම නිලධාරි මහත්වරුන්ට ඒ පහසුකම ලබා දෙන එක හොඳ දෙයක් බව අමාත්‍යාංශය හැටියට අපිත් දකිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන් වන අතුරු ප්‍රශ්නය මෙයයි. දැන් ඔබතුමාගේ අමාත්‍යාංශය හරහාම සංවර්ධන නිලධාරීන් හැටියට උපාධිධාරීන් විශාල ප්‍රමාණයක් පත් කළා. ඒ පත් කිරීමත් සමඟ ග්‍රාම නිලධාරිවරුන්ගේත් ඒ උපාධිධාරීන්ගේත් රාජකාරි ලැයිස්තුවේ යම් යම් ගැටලු ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ආගමික, සංස්කෘතික හා සමාජ සුබසාධන වැඩ කටයුතු පැවරීමක් සිදු කර තිබෙනවා. මේ තුළින් රාජකාරිමය ගැටලු රැසක් බිම් මට්ටමෙන් ඇති වෙලා තිබෙනවා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ග්‍රාම නිලධාරිතුමා හෝ ග්‍රාම නිලධාරිතුමිය හරහා ඉටු වන සේවාව වඩාත් ගුණාත්මකභාවයෙන් වර්ධනය කරන්නට මෙම ගැටලුව විසඳන්නේ කවදාද කියා. ඒ වාගේම ග්‍රාම නිලධාරිතුමන්ලා අතරත් උපාධිය ලබපු අය 1,700ක් ඉන්නවා. ඒ ග්‍රාම නිලධාරිතුමන්ලාව සුදුසු වැටුප් තලයක ස්ථාපනය කරලා රාජකාරි ලැයිස්තුවේ තිබෙන අර්බුද, ගැටලු නිරාකරණය කරන්නට කටයුතු කරන්නේ කවදාද? ඒ වාගේම සමෘද්ධි නිලධාරිනුත් II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරලා, සමෘද්ධි නිලධාරින් 1,773 දෙනෙක් III වන ශ්‍රේණියට වට්ටලා තිබෙනවා. මේ අසාධාරණකම් සියල්ලක්ම සාධාරණීකරණය කරලා නිවැරදිභාවයට ලක් කරන්න කටයුතු කරන්නේ කවදාද කියලා මම ඔබතුමාගෙන් අවසාන වශයෙන් අහනවා.

**ගරු විජය දහනායක මහතා**
( மாண்புமிகு விஜய தஹநாயக்க)
(The Hon. Wijaya Dahanayake)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළ වන කරුණුවලට මූලිකත්වය දීලා මම කථා කරන්නම්. ඔබතුමා කියන විධියට සංවර්ධන නිලධාරි තනතුරුවල කරන සේවාවත්, ග්‍රාම නිලධාරිවරුන් කරන සේවාවත් අතර පටලැවිල්ලක් වෙන්න කිසිම හේතුවක් නැහැ. සංවර්ධන කටයුතු තෝරා ගැනීම සහ ජනතාව ඒ බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු හඳුනා ගැනීම යන කරුණුවලදී ග්‍රාම නිලධාරිතුමාට යම් ආකාරයක සහයෝගයක් තමයි ඒ බල ප්‍රදේශවලට නම් කරපු සංවර්ධන නිලධාරින්ගෙන් සිද්ධ වෙන්නේ. ඒ නිසා සහයෝගයක් මිස, කිසිම ආකාරයක ගැටුමක් තිබෙනවා කියලා අපි දකින්නේ නැහැ. ගම්වල තිබෙන නියම ආකාරය තව තවත් හොඳින් තේරුම් ගන්න පහසුවක් ඇති වන බව තමයි ග්‍රාම නිලධාරි වසම් තුළ සංවර්ධන නිලධාරි තනතුරුවලට උපාධිධාරින් පත් කිරීම තුළින් අපි දකින්නේ. ඒ නිසා එවැනි ගැටලුවක් ඇති වන්නේ නැහැ ගරු මන්ත්‍රීතුමනි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 12 - 2874/'12 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඇමතිතුමා, පිළිතුර තිබෙනවානේද? වෙලාවත් තිබෙනවා. ඒ නිසා පිළිතුර දෙන්නකෝ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සති දෙකක් ඇතුළත පිළිතුර දෙන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදේශ කටයුතු අමාත්‍යාංශය : ප්‍රධාන නිලධාරින්
### வெளிநாட்டலுவல்கள் அமைச்சு : முக்கிய அதிகாரிகள்
### MINISTRY OF EXTERNAL AFFAIRS : KEY OFFICIALS

2889/'12

**13. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරින් කවුරුන්ද;

(ii) ඉහත සඳහන් කළ එක් එක් නිලධාරියාගේ සේවා පළපුරුද්ද කොපමණද;

(iii) ඔවුන් විසින් ආවරණය කරන ක්ෂේත්‍ර කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ලොව පුරා සේවය කරන ශ්‍රී ලාංකික සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ආයතනික වාර්තා කිරීමේ සටහන අනුව ඔවුන් අමාත්‍යාංශයට වාර්තා කරන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அமைச்சின் முக்கிய அதிகாரிகள் யார் என்பதையும்;

(ii) மேலே குறிப்பிடப்பட்ட ஒவ்வொரு அதிகாரி யினதும் வேலை அனுபவம் என்ன என்பதையும்;

(iii) அவர்களால் கையாளப்படும் விடயப்பரப்புகள் என்ன என்பதையும்

அவர் தனித்தனியாக இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) வெளிநாட்டலுவல்கள் அமைச்சின்கீழ் உலகம் பூராகவும் பணியாற்றும் இலங்கை ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) நிறுவன அறிக்கையிடல் அட்டவணைக்கு அமைய அவர்கள் எவ்வாறு அமைச்சுக்கு அறிக்கையிடுகிறார்கள் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of External Affairs:

(a) Will he inform this House, separately -

(i) the key officials of the Ministry;

(ii) the work experiences of each official mentioned above; and

(iii) the areas covered by them?

(b) Will he state -

(i) the number of Sri Lankan employees working under the Ministry of External Affairs worldwide; and

(ii) as to how they report to the Ministry with the organizational reporting chart?

(c) If not why?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

Hon. Member, shall I read out the Answers one by one?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, the microphone system is malfunctioning. I cannot hear what is being said.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Hon. Member, you have asked for the list of -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am sorry, Hon. Deputy Minister. First, I want to get the House in order because what you are saying cannot be heard.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Okay.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
හොඳට ඇහෙනවා. කන සුද්ද කර ගෙන එන්න කියන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ කන සුද්ද කරන්න කලින් ඔබතුමාගේ මොළය සුද්ද කර ගෙන එන්න. [බාධා කිරීම්]

The mike system is not functional. Hon. Deputy Speaker, when the Sittings finish today, please ensure that these archaic things are restored to the proper order and functional so that we can hear what is being said.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
I, of course, can hear it.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is because you are at the head table.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
But, I do not know about the other Members. Can you all hear it?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ මොළය හොඳ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ. අපට නම් හොඳට ඇහෙනවා. අපේ මුළු සර්වාංගයම-

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
Hon. Deputy Speaker, can I go ahead with the Answer now?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Yes.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

(a) Hon. Member, the information you have asked for in a(i), (ii) and (iii) are given below as a table.

[ගරු නියෝමාල් පෙරේරා මහතා]

| S/No | Designation | Name | Work Experience (years) | Area Covered |
|---|---|---|---|---|
| 1 | Secretary | Mr. K. Amunugama | 34 | |
| 2 | Additional Secretary | Mrs. K. Senewiratne | 28 | Political Affairs (West), United Nations Multilateral Affairs and Human Rights Conferences |
| 3 | Additional Secretary | Mr. R.M.A. Rathnayake | 26 | Administration and Finance |
| 4 | Additional Secretary | Mr. E. Rodney M. Perera | 24 | Public Communications, Consular Affairs, Middle East and Africa |
| 5 | Legal Adviser (On contract basis) | Mr. Thusantha Wijemanna | 35 | Legal matters related to the Ministry |
| 6 | Director-General | Mrs. R.D. Rajapakse | 18 | SAARC |
| 7 | Director-General | Mrs. W.A.T. Gunatilleke | 18 | Consular Affairs |
| 8 | Chief Accountant | Mrs. K.D.L. Kandanarachchi | 20 | Financial Administration |
| 9 | Chief Internal Auditor | Mr. G.A. Senarathna | 29 | Internal Auditing |
| 10 | Actg. Director-General | Mrs. Aruni Ranaraja | 17 | United Nations Multilateral Affairs and Human Rights Conferences |
| 11 | Actg. Director-General | Mr. U.L.M. Jauhar | 17 | Middle East & Commonwealth of Independent States |
| 12 | Actg. Director-General | Mr. Dharshana Perera | 17 | South Asia |
| 13 | Actg. Director-General | Mr. M.K. Pathmanadan | 17 | Economic Affairs |
| 14 | Actg. Director-General | Mr. K.S. Jayaweera | 17 | Overseas Administration |
| 15 | Actg. Director-General | M.R.K. Lenagala | 15 | United Nations Multilateral Affairs and Human Rights Conferences |
| 16 | Actg. Director-General | Mrs. Shobini Gunasekera | 15 | East Asia & Pacific |
| 17 | Actg. Director-General | Mrs. Himali A. Serasinghe | 15 | Europe and Americas |
| 18 | Actg. Director-General | Mrs. C.A.C.I. Colonne | 15 | Africa |
| 19 | C/Prot. & DG to the Task Force Secretariat for CHOGAM 2013 | Mr. M.J.P. Jayasinghe | 15 | Protocol Affairs & Task Force Secretariat for Commonwealth Heads of Government Meeting 2013 |
| 20 | Actg. Director-General | Mr. B.N. Pathiratne | 13 | General Administration |

(b) (i) 515.

(ii) Through the relevant Head of Mission.

(c) Does not arise.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you, Hon. Deputy Minister, for the Answer. With the revelation of the information about the key officials, I am sure the Ministry of External Affairs has a reservoir of talents. Every official whom you mentioned has an experience of more than 15 years. Is their experience being put to use by the Ministry of External Affairs or is there a political dimension to the work of the Ministry because latterly, you have been making more enemies than friends around the world. So, this reservoir of talents, I hope, is put to good use so that we will have more friends internationally than enemies. Hon. Deputy Minister, would you please elaborate on that?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Hon. Member, we are carrying on the "Mahinda Chintana" policy of the leadership and those officials who are capable of handling any issue are doing it very well and we have made more friends than enemies.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

That is your perception.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

That is what is happening.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, my second Supplementary Question is this. Latterly, you have made more non-

career appointments to the diplomatic positions rather than career diplomats in the Ministry of External Affairs. As a result, 54 per cent of your ambassadorial positions have been selected from outside. With this, there is also militarization of the diplomactic corps and three countries have rejected the nominees you have put forward. So, I would appreciate, if whatever *chintanaya* that you believe in carries forward the country's policy, that it does not alienate itself from the European Union, the USA, Japan, India et cetera. I would appreciate if a spontaneous answer comes from you.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

If I am to mention two officers, Admiral Thisara Samarasinghe and the Ambassador of Sri Lanka to Japan, both of whom had served as the Commander of the Navy, are doing a fantastic job.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, if you can answer my Question rather than go on a voyage of discovery, it would be better.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

I am telling you about the military appointments and non-career diplomats.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I asked about the rejected nominees. If you answer to that, it would be easier.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

You were asking me about non-career diplomats. So, I mentioned two non-career diplomats who had been in the military as well. I am answering both your questions with the same answer.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

My Question was not about that. My Question was about the 55 per cent non-career diplomats appointed and about the two military people who have been rejected. If you answer that, it would be easier.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

For political reasons, they may get rejected but we have sent the best officers to serve the country. So, that is the situation. We pay more attention to security intelligence rather than face the consequences of the war. So, we would like to prevent issues rather than face issues.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, I know that you have a very difficult brief to make at this particular moment. But, the question that I posed to you is -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Hon. Member, that is your third Supplementary Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, the time seems to be against you today. Your amiable, generous disposition -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Look at the time. It is past 2.00 p.m.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, we are on the 14th Question.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

No, this is the 13th Question.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Deputy Minister, the Labour GSP, which is so important to the commercial activities of this country, was taken off from Sri Lanka two years ago. At that particular moment, we said the loss to the country would be roughly about Rs. 1.4 billion. Today, collectively, the loss is about Rs. 5 billion. Now, I am informed that the Government, which rejected certain policies that had to be implemented earlier, has stealthily applied back again to the European Union for that. So, have you now accepted those conditions or things they expected you to do or have you not applied again?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Actually, that does not come under our Ministry although we facilitate it to be achieved through other Ministries.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, Ambassador Ravinatha Aryasinha -

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

That is only facilitated by us but it is the task of the Ministry of Labour and Labour Relations or the Ministry of Industry and Commerce. The GSP Plus comes under the Ministry of Industry and Commerce; labour comes under the Ministry of Labour and Labour Relations. Therefore, we are only facilitators of those Ministries. So, I will not be able to answer you regarding those matters.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, Hon. Deputy Minister, facilitation comes under you.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

For us, it is a matter of forwarding the documents; taking decisions is for those Ministries.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

So, you are only a postman, is it?

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

The Question you are asking is not relevant to our Ministry.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, facilitation for what purpose? If you say that you are only facilitating -

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)

Hon. Member, it does not come under the Ministry of External Affairs.

## දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරු : හිඟය
### தீவிர சிகிச்சை நிபுணத்துவ மருத்துவர்கள் : பற்றாக்குறை
### INTENSIVE CARE SPECIALISTS : SHORTAGE

3064/'12

14. **ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සෞඛ්‍ය අමාත්‍යවරයා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැඩි සත්කාර විශේෂඥ වෛද්‍ය පුහුණුව ආරම්භ කිරීමට මේ වනවිට අනුමතිය ලබා දී තිබුණද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතිය මේ දක්වා ලබා නොදීම හේතුවෙන් එම පුහුණු කටයුතු ආරම්භ කිරීම ප්‍රමාදවී ඇති බවත්;

(ii) එම තත්ත්වය යටතේ දැඩි සත්කාර ඒකකවලදී රෝගීන්ට නිසි සුදුසුකම් නොමැති වෛද්‍යවරුන්ගේ සේවය ලබාගැනීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින රෝහල් සංඛ්‍යාව සහ අවශ්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රෝහල්වල ප්‍රතිකාර ලබන රෝගීන්ගේ ජීවිත අවදානම් තත්ත්වයක පවතින විට සහ ඉහත සඳහන් පරිදි වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින විට උක්ත වෛද්‍ය පුහුණුව ලබාදීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතිය ලබා නොදීමට හේතු කවරේද;

(iii) අදාළ අනුමතිය ලබාදී උක්ත පුහුණු කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சுகாதார அமைச்சரும் பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவும் தீவிர சிகிச்சை நிபுணத்துவ மருத்துவப் பயிற்சியை ஆரம்பிப்பதற்கு ஏற்கனவே அங்கீகாரம் வழங்கியுள்ள நிலையில் சுகாதார அமைச்சின் செயலாளரின் அங்கீகாரம் இன்றுவரை வழங்கப்படாமையினால் மேற்படி பயிற்சி நடவடிக்கைகளை ஆரம்பிப்பதில் தாமதம் ஏற்பட்டுள்ளதென்பதையும்;

(ii) மேற்படி நிலைமையின் கீழ் தீவிர சிகிச்சைப் பிரிவுகளில் நோயாளர்களுக்கு உரிய தகைமைகளைப் பெறாத மருத்துவர்களின் சேவையைப் பெற நேரிட்டுள்ளதென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i ) தற்போது தீவிர சிகிச்சை நிபுணத்துவ மருத்துவர்களின் பற்றாக்குறை காணப்படும் வைத்தியசாலைகளின் எண்ணிக்கை மற்றும் தேவையான மருத்துவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii ) வைத்தியசாலைகளில் சிகிச்சை பெறும் நோயாளர்களின் உயிர் ஆபத்தான நிலைமையில் காணப்படுகின்றபோதும் மேற்கூறப்பட்டவாறு மருத்துவர்கள் பற்றாக்குறை காணப்படுகின்றபோதும் மேற்படி மருத்துவ பயிற்சியை பெற்றுக்கொடுப்பதற்கு அமைச்சின் செயலாளர் அங்கீகாரம் வழங்காதிருப்பதற்கான காரணங்கள் யாவை என்பதையும்

(iii ) உரிய அங்கீகாரத்தை வழங்கி மேற்படி பயிற்சி நடவடிக்கையை துரிதமாக ஆரம்பிக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the commencement of Intensive Care Specialist Training has been delayed so far due to the approval not been granted by the Secretary to the Ministry of Health despite the fact that the approval of the Minister of Health and the University Grants Commission has already been granted by now; and

(ii) under these circumstances, at intensive units, patients are compelled to obtain the service of doctors who do not possess the required qualification?

(b) Will he state -

(i) the number of hospitals with a dearth of intensive care specialists and the number of such specialists required;

(ii) the reasons for not granting the approval of the Secretary to the Ministry of Health for the aforesaid training while the lives of the patients who are undergoing treatment in hospitals are at risk and a dearth of the aforesaid specialists exist at hospitals at present; and

(iii) whether speedy action will be taken to commence the above training by granting the aforesaid approval?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (I) දැඩි සත්කාර විශේෂඥ වෛද්‍ය පුහුණුව අරම්භ කිරීමේ ප්‍රමාදයක් නොමැත.

(II) රජයේ රෝහල්වල කිසිදු විශේෂිත ඒකකයක ඌන සුදුසුකම් සහිත වෛද්‍යවරු සේවය නොකරති.

(ආ) (I) දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් නොපවතී.

(II) සහ (III)
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දැනටමත් දැඩි සත්කාර විශේෂඥ වෛද්‍ය පුහුණුව ආරම්භ කර ඇත.

(ඇ) පැන නොනඟී.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමා කියන විධියට නම් මෙතැන කිසිම ප්‍රශ්නයක් නැහැ. වෛද්‍ය නිලධාරි සංගමයේ වෛද්‍ය එස්.එච්. කොළඹගේ මහත්මයාත් කියනවා මේ පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා, මේ හිඟය නිසා සුදුසුකම් නැති, අවශ්‍ය පුහුණුව නැති විශේෂඥ වෛද්‍යවරුන් දැඩි සත්කාර ඒකකවලට යොදවන්න වෙලා තිබෙනවා කියලා. එතකොට ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියන එකයි, සංගමයේ කැඳවුම්කරු කියන එකයි සම්පූර්ණයෙන්ම වෙනස්.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුහුණුවක් නැති, සුදුසුකම් නැති යම් වෛද්‍යවරයෙක් ඉන්නවා නම් අමාත්‍යාංශයේ ලේකම්තුමාට කියන්න කියලා ඒ අදාළ සංගමයට කියන්න. එතකොට අපට ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඔබතුමා ප්‍රශ්නය වටහා ගෙන නැහැ. පුහුණුව සඳහා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය දෙන්නේ නැහැ කියලා තමයි කියන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අනුමැතිය දීලා තිබෙනවා. අනුමැතිය දීලා තමයි පුහුණුව පටන් අරගෙන තිබෙන්නේ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අනුමැතිය දීලා නැහැ කියනවා නේ. අනෙක, ඔබතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙමින් කියනවා, එහෙම කිසිම අඩු පාඩුවක් නැහැ කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

දැඩි සත්කාර ඒකකයේ විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුහුණුව ආරම්භ කිරීමේ ප්‍රමාදයක් නැහැ. දැනටමත් ලේකම්තුමාගේ අනුමැතිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියා පදිංචි වෙලා, කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් දැඩි සත්කාර විශේෂඥ වෛද්‍ය පුහුණුව ආරම්භ කර තිබෙනවා. මේ පුහුණුව සඳහා වෛද්‍ය විශාරද, කායික වෛද්‍යවේදය, වෛද්‍ය විශාරද නිර්වින්දන විභාගයේ දෙවැනි කොටස සමත් වෛද්‍යවරුන්ට අනුයුක්ත විය හැක. තවද විශේෂඥ නොවන වෛද්‍යවරුන් සඳහා දැඩි සත්කාර පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ඉහත ආයතනය මඟින් ආරම්භ කොට ඇත.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දැන් මෙතුමාගේ උත්තරය තුළම පරස්පරයක් මතු වෙනවා. එතුමා කියනවා දැන් පුහුණුව ආරම්භ කර තිබෙනවා කියලා. මම ප්‍රශ්නයේ ආ (i) කොටසින් අහන්නේ "මේ වන විට දැඩි සත්කාර විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් පවතින රෝහල් සංඛ්‍යාව සහ අවශ්‍ය වෛද්‍යවරු සංඛ්‍යාව කොපමණද?" කියලා. මෙතුමා කියනවා එහෙම හිඟයකුත් නැහැ, අවශ්‍ය ප්‍රමාණයකුත් නැහැ කියලා. නැවතත් උත්තරයක් දෙමින් එතුමා කියනවා, ඒ හිඟය නැති කිරීම සඳහා පුහුණුව ආරම්භ කර තිබෙනවාලු. ඒ අනුව මෙතුමා මේ සභාව නොමඟ යවනවා නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ඇත්තටම අපි වෛද්‍යවරු පුහුණු කිරීම් කර ගෙන යනවා. වෛද්‍යවරු අවශ්‍යයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඉතින් දැන් ඔබතුමා කියනවා නේ, හිඟයක් නැහැ කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

එක වෛද්‍යවරයෙක් නොවෙයි, වෛද්‍යවරු කණ්ඩායමක් හැටියට තමයි දැඩි සත්කාර ඒකකයේදී ක්‍රියාත්මක වන්නේ. ඒ නිසා අපට මේ දැඩි සත්කාර සේවාව කර ගෙන යන්න පුළුවන්කම තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට පිළිතුර ලැබුණේ නැහැ. මම අහන්නේ මේකයි. දැඩි සත්කාර ඒකකයේ පුහුණුවලත් වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒක කියන්නේ අපි නොවෙයි. ඒ සංගමයේ වෛද්‍යවරයෙක්; එහි ප්‍රධාන කැඳවුම්කරු. මෙතුමා කියනවා එහෙම හිඟයක් නැහැ කියලා. මෙතුමා ඊට පස්සේ පිළිතුරු දෙනවා, දැන් ඒ වෛද්‍යවරු පුහුණු කරන්න කටයුතු යොදලා තිබෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට කලිනුත් පාර්ලිමේන්තුවේදී මෙවැනිම ප්‍රශ්නයක් අහලා තිබෙනවා. ඔබතුමාත් දන්නවා, -මේ රටම දන්නවා - අද විශේෂඥ වෛද්‍යවරුන්ගේ හිඟයක් තිබෙන බව. මේ හිඟය නිසා සාමාන්‍ය මනුෂ්‍යයකුට තත්පර ගණනකට; විනාඩි ගණනකට විශේෂඥ වෛද්‍යවරයකුගේ සේවය ලබා ගන්න රුපියල් 10,000ක් නැත්නම් 8,000ක් ගෙවන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යතුමනි, මේකට අවශ්‍ය පියවර ගන්නේ නැද්ද?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ නිදහස් සෞඛ්‍ය සේවාව තුළ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විශාල හිඟයක් තිබෙනවා. නමුත් දැනට ඉන්න ප්‍රමාණය රෝගී ජනතාවගේ අවශ්‍යතා ඉටු කිරීම සඳහා ප්‍රමාණවත්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

කිසිසේත්ම නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

හෘදය සැත්කම්වල විතරයි ප්‍රමාදයක් තිබෙන්නේ. වකුගඩු ශල්‍යකර්ම කර ගෙන යනවා. ඒවායේ ප්‍රමාදයක් නැහැ. හෘදය රෝග සැත්කම් සඳහා පොරොත්තු ලේඛනයක් තිබෙනවා. අපි දැඩි සත්කාර ඒකකවල කටයුතු ඉතාම හොඳින් කර ගෙන යනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිඟයක් නැහැයි කියලා මෙතුමා කියනවා. නැවතත් එතුමා කියනවා හෘදය රෝග-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

අපේ වෛද්‍ය සේවාවේ එහෙම හිඟයක් නැහැ. අපි වෛද්‍යවරු පුහුණු කරනවා. වෛද්‍යවරු අවශ්‍යයි. ඕනෑම රටක වෛද්‍යවරු සංඛ්‍යාවක් නැහැ.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ප්‍රශ්නයක් ඇහුවේ උත්තරයක් ලබා ගන්නයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි පිළිතුරක් ලබා දෙන්න. දැන් ඔබතුමාත් අහගෙන හිටියා, මෙතුමාම කියනවා එහෙම හිතයක් නැතිලු. ඒ වාගේම කියනවා, හෘදය සැත්කම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවාලු. ආයෙත් කියනවා, වකුගඩු සම්බන්ධයෙන් ප්‍රශ්නයක් -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ඔබතුමා අතුරු ප්‍රශ්න තුනම අහලා ඉවරයි. දෙවන වටය.

## එස්.පී. ලියනගේ මහත්මිය ඝාතනය : විධිමත් පරීක්ෂණයක්

திருமதி எஸ்.பீ. லியனகேயின் கொலை : முறைசார்ந்த விசாரணை

ASSASSINATION OF MRS. S.P LIYANAGE : PROPER INVESTIGATION

2708/'12

2. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල, යක්කලමුල්ල, කරාගොඩ, "ජයසෙත" නිවසේ පදිංචිව සිටි විශ්‍රාමලත් විදුහල්පතිනි එස්. පී. ලියනගේ මහත්මිය 2012 ජනවාරි 09 දින උදේ 8.30 - 9.30 අතර කාලය තුළදී අභිරහස් ලෙස ගෙමිදුලේදී ඝාතනය කර තිබූ බවත්,

(ii) මේ දක්වා ඊට සම්බන්ධ සැකකරුවන් අත් අඩංගුවට ගෙන නොමැති බවත්,

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මරණය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, පළපුරුදු දක්ෂ නිලධාරීන් යොදවා සැකකරුවන් අත්අඩංගුවට ගැනීමටත් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமாவரைக் கேட்ட வினா:

(அ) (i) காலி, யக்கலமுல்ல, கராகொட, "ஜயசெத" வீட்டில் குடியிருந்த ஓய்வுபெற்ற பாடசாலை அதிபர் திருமதி எஸ்.பீ. லியனகே 2012 சனவரி 09ஆம் திகதி காலை 8.30 - 9.30 இடைப்பட்ட நேரத்தில் மர்மமான முறையில் வீட்டு முற்றத்தில் கொலை செய்யப்பட்டிருந்தார் என்பதையும்;

(ii) இதுவரை அதனுடன் தொடர்புடைய சந்தேக நபர்கள் கைது செய்யப்படவில்லை யென்பதையும்

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மரணம் தொடர்பாக முறைசார்ந்த விசாரணையொன்றை நடத்துவதற்கும் அனுபவம் வாய்ந்த திறமையான உத்தியோகத் தர்களை ஈடுபடுத்தி சந்தேக நபர்களைக் கைது செய்வதற்கும் நடவடிக்கை எடுப்பாரா என்பதையும்

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Is he aware that -

(i) Mrs. S.P. Liyanage, a retired principal who resided at "Jayasetha", Karagoda, Yakkalamulla in Galle had been mysteriously killed in her compound between 8.30 a.m. to 9.30 a.m. on 09th January, 2012; and

(ii) the suspects of the aforesaid murder have not been taken into custody up to now?

(b) Will he inform this House -

(i) whether action will be taken to get the suspects arrested by deploying experienced and capable officers and to conduct a proper investigation into this death; and

(ii) if so, when?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්. විශ්‍රාමලත් විදුහල්පතිනි එස්.පී. ලියනගේ මහත්මිය 2012 ජනවාරි 09 දින අභිරහස් ලෙස කපා කොටා ඝාතනය කර ඇත.

(ii) මෙම සිද්ධියට අදාළව විශේෂ විමර්ශනයක් සිදු කර එමඟින් අනාවරණය වූ තොරතුරු අනුව 2012.11.22 දින සැකකරුවන් තිදෙනෙකු අත් අඩංගුවට ගෙන ඇත.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

(ආ) (i) මේ වන විටත් විශේෂ විමර්ශනයක් සිදු කර 2012.11.22 දින සැකකරුවන් තිදෙනකු අත් අඩංගුවට ගෙන ඇති අතර ඔවුන් 2012.11.23 දින අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කර ඇත.

(ii) ඉහත පිළිතුරෙහි සඳහන් කර ඇත.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
( பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7 - 3067/'12 - (2), ගරු අජිත් පී. පෙරේරා මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවට අයති ඉඩම : විස්තර

සிறு ஏற்றுமதிப் பயிர்கள் திணைக்களத்திற்குச் சொந்தமான காணி: விபரம்

LAND BELONGING TO DEPARTMENT OF MINOR EXPORT CROPS : DETAILS

3514/'13

**8. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු වසන්ත අලුවිහාරේ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு வசந்த அலுவிஹாரே சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon.Wasantha Aluwihare)

සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයට අයත් තිබ්බටුමුල්ල ග්‍රාමයේ සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක් ඇති බව එතුමා දන්නේද?

(ආ) සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුවට අයත් ඉහත සඳහන් ඉඩමේ,

(i) සම්පූර්ණ භූමි ප්‍රමාණය;

(ii) වගා කර ඇති භූමි ප්‍රමාණය;

(iii) වගා කටයුතු සිදුකර නොමැති භූමි ප්‍රමාණය;

(iv) වගා කර ඇති සුළු අපනයන භෝගවලින් ලබන ආදායම හෝ පාඩුව;

(v) අනෙකුත් සම්පත්වලින් ලබන ආදායම හෝ පාඩුව;

(vi) සේවයේ නියුතුව සිටින සේවක සේවිකාවන් සංඛ්‍යාව;

(vii) සමස්ත වාර්ෂික ලාභය හෝ පාඩුව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සුළු අපනයන භෝග දෙපාර්තමේන්තුව සතු ඉහත සඳහන් ඉඩම මේ වන විට යම් පිරිස් විසින් අත්පත් කරගෙන තිබේද;

(ii) එසේ අත්පත් කරගෙන තිබේ නම්, කවර පදනමක් යටතේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தளை மாவட்டத்தில் உக்குவெல பிரதேச செயலாளர் பிரிவின் ஆளுகைப் பிரதேசத்திற்குரிய திப்படுமுல்லைக் கிராமத்தில் சிறு ஏற்றுமதிப் பயிர்கள் திணைக்களத்திற்குச் சொந்தமான ஒரு காணி உள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) சிறு ஏற்றுமதிப் பயிர்கள் திணைக்களத்திற்குச் சொந்தமான மேலே குறிப்பிட்ட காணியின்,

(i) முழு நிலப்பரப்பு எவ்வளவென்பதையும்;

(ii) பயிர்ச்செய்கை மேற்கொள்ளப்பட்டுள்ள நிலப் பரப்பு எவ்வளவென்பதையும்;

(iii) பயிர்ச்செய்கை நடவடிக்கைகள் மேற்கொள்ளப் படாத நிரப்பரப்பு எவ்வளவென்பதையும்;

(iv) பயிர்ச்செய்கை செய்யப்பட்டுள்ள சிறு ஏற்றுமதிப் பயிர்களிலிருந்து பெறப்படும் இலாபம் அல்லது நட்டம் யாதென்பதையும்;

(v) ஏனைய வளங்களிலிருந்து கிடைக்கப்பெறும் இலாபம் அல்லது நட்டம் யாதென்பதையும்;

(vi) பணிக்கமர்த்தப்பட்டுள்ள ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(vii) வருடாந்த மொத்த இலாபம் அல்லது நட்டம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) சிறு ஏற்றுமதிப் பயிர்கள் திணைக்களத்திற்குச் சொந்தமான மேலே குறிப்பிட்டுள்ள காணியைத் தற்போது ஒரு குழுவினர் கைப்பற்றிக் கொண்டுள்ளனரா என்பதையும்;

(ii) இவ்வாறு கைப்பற்றப்பட்டிருப்பின் அது எவ்வடிப்படையில் என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், என்?

asked the Minister of Minor Export Crop Promotion:

(a) Is he aware that there is a land in the village of Thibbatumulla in the Ukuwela Divisional Secretary's Division in the Matale District that belongs to the Department of Minor Export Crops?

(b) Will he inform this House -

(i) the total extent;

(ii) the extent that is cultivated;

(iii) the extent in which no cultivation has been done;

(iv) the profit earned or loss incurred out of the minor export crops that have been cultivated;

(v) the profit or loss made out of other resources;

(vi) the number of employees employed; and

(vii) the total annual profit or loss;

of the above land that belongs to the Department of Minor Export Crops?

(c) Will he state -

(i) whether this land that belongs to the Department of Minor Export Crops has been acquired by some persons; and

(ii) if it has been so acquired, on what basis has it been done?

(d) If not, why?

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே)
(The Hon. Reginold Cooray)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) ඔව්. මෙම ඉඩම අයත් වන්නේ සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවටයි.

(ආ) (i) අක්කර 212යි, රූඩ් 01යි, පර්චස් 27 යි.

(ii) අක්කර 104යි.

(iii) අක්කර 108යි.

| | | |
|---|---|---|
| ජල පෝෂිත | අක්කර | 80 |
| හුණුගල් **වල** | අක්කර | 05 |
| නිල නිවාස/රජයේ නිවාස | අක්කර | 06 |
| පාරවල් | අක්කර | 05 |
| කාර්යාල ඇතුළු ගොඩනැඟිලි | අක්කර | 11 |
| සුසාන භූමියට වෙන් කළ | අක්කර | 01 |
| **එකතුව** | **අක්කර** | **108** |

(iv) 2010 වර්ෂයේ ආදායම රු. 929,060.00
2011වර්ෂයේ ආදායම රු. 679,977.00
2012 වර්ෂයේ ආදායම රු. 1,322,489.00

(v) ආදායම

| | **2010 වර්ෂය** | **2011 වර්ෂය** | **2012 වර්ෂය** |
|---|---|---|---|
| a) අපි වවමු රට නඟමු (එළවළු නිෂ්පාදනය) | රු. 28,535.00 | රු. 18,836.00 | රු. 17,465.00 |
| b) කාර්මික ප්‍රකාශන අලෙවිය | රු. 15,070.00 | රු. 8,400.00 | රු. 10,785.00 |
| c) නිවාස කුලී | රු.435,000.00 | රු.445,800.00 | රු.467,600.00 |
| **එකතුව** | **රු.478,605.00** | **රු.473,036.00** | **රු.495,850.00** |

පාඩු ලබා නොමැත.

(vi) 145

(vii) මූල්‍යමය ලාභ අපේක්ෂාවෙන් පවත්වාගෙන යන ආයතනයක් නොවන බැවින් ලාභය හෝ පාඩුව ගණනය නොකෙරේ. මෙම මධ්‍යස්ථානය මඟින් සමස්ත ශ්‍රී ලංකාවේම අපනයන කෘෂි භෝග පිළිබඳ පර්යේෂණ කටයුතු පවත්වාගෙන යමින් නව තාක්ෂණ ක්‍රම හඳුන්වා දීම, ක්ෂේත්‍ර ගැටලු විසඳීම හා වෙනත් තාක්ෂණික උපදෙස් සැපයීම මඟින් කෙරෙන සේවය අපනයන කෘෂි භෝග නිෂ්පාදනයේ වැඩිවීම, අපනයන පරිමාව, විදේශ විනිමය ඉපයීම සහ රැකියා උත්පාදනය අනුව මිල කළ යුතුය.

(ඇ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

## කොළඹ - යාපනය පෞද්ගලික බස් සේවාව : මාර්ග බලපත්‍ර ගාස්තුව
## கொழும்பு - யாழ்ப்பாணம் தனியார் பேருந்துச் சேவை : பாதை உரிமக் கட்டணம்
COLOMBO-JAFFNA PRIVATE BUS SERVICE : ROUTE LICENCE FEE

3537/'13

9. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු ඒ. විනායගමූර්ති මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க- மாண்புமிகு அ. விநாயகமூர்த்தி சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. A. Vinayagamoorthy)
පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ සිට යාපනය දක්වා පෞද්ගලික බස් මාර්ග බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව කොපමණද;

(ii) කොළඹ සිට හම්බන්තොට දක්වා මාර්ග බලපත්‍රයක් සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වෙනත් දිස්ත්‍රික්කවල මාර්ග බලපත්‍රයක් සඳහා රු. 3000/= ක් පමණක් අය කරමින් බලධාරීන් විසින් කොළඹ සිට යාපනය දක්වා පෞද්ගලික බස් මාර්ග

[ගරු ජෝන් අමරතුංග මහතා]

බලපත්‍රයක් සඳහා පමණක් රුපියල් ලක්ෂ 11ක වාර්ෂික ගාස්තුවක් අය කරනු ලබන්නේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ)(i) கொழும்பிலிருந்து யாழ்ப்பாணத்துக்கான தனியார் பேரூந்துப் பாதை உரிமக் கட்டணத்தையும்;

(ii) கொழும்பிலிருந்து அம்பாந்தோட்டைக்கான பாதை உரிமக் கட்டணத்தையும்

அவர் கூறுவாரா?

(ஆ) கொழும்பிலிருந்து யாழ்ப்பாணத்துக்கான வருடாந்த தனியார் பேரூந்துப் பாதை உரிமக் கட்டணமாக மட்டும் ரூபா 11 இலட்சமும் அதேவேளை ஏனைய மாவட்டங்களில் பாதை உரிமக் கட்டணமாக ரூபா 3,000 மட்டுமே அதிகாரிகளால் அறவிடப் படுகின்றதா என்பதையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Private Transport Services:

(a) Will he state -

(i) the licence fee for a private bus route licence from Colombo to Jaffna; and

(ii) the licence fee for route licence from Colombo to Hambantota?

(b) Will he also state whether the authorities are charging Rs. 11 Lakhs of annual fee for a private bus route licence only from Colombo to Jaffna whereas only Rs. 3000/- is charged for a route licence in other districts?

(c) If not, why?

**ගරු සී.බී. රත්නායක මහතා (පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - தனியார் போக்குவரத்துச் சேவைகள் அமைச்சர்)

(The Hon. C.B. Rathnayake - Minister of Private Transport Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) රු. 3000/-.

නමුත්, කොළඹ - යාපනය මගී සේවා අවසර පත්‍ර නිකුත් කරනු ලැබ ඇත්තේ අමප/10/2374/445/077 හා 2010.10.14 දිනැති යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ සම්බන්ධ වන බස් සේවා විධිමත් කිරීම සම්බන්ධයෙන් වූ අමාත්‍ය මණ්ඩල තීරණය අනුවයි.

ඒ අනුව දිවයිනේ විවිධ ප්‍රදේශවල සිට යාපනය ඇතුළු යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ සඳහා ප්‍රවාහන පහසුකම් සැලැසීමට මගී සේවා අවසර පත් නිකුත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, කොළඹ - යාපනය අවසර පත්‍රයක් සඳහා අය කරන ගාස්තුව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| අර්ධ සුඛෝපභෝගී | - | රු: 700,000/- |
| අධි සුඛෝපභෝගී / සුඛෝපභෝගී | - | රු: 1,100,000/- |

කොළඹ - යාපනය මාර්ගය සඳහා සාමාන්‍ය මගී සේවා අවසර පත්‍ර නිකුත් කර නොමැත.

(ii) රු: 3000/-.

නමුත්, 2005 වර්ෂයේ අංක අමප/05/1461/031/36 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍ර නිකුත් කිරීම සඳහා, මේ වන විට අනුගමනය කළ යුතු ක්‍රමවේදය වන්නේ ටෙන්ඩර් පටිපාටියයි.

මෙම ක්‍රමවේදය හඳුන්වාදීමට පෙර කොමිෂන් සභාව විසින් දිවයින පුරා අන්තර් පළාත් මාර්ග සඳහා මගී සේවා අවසර පත්‍ර නිකුත් කරන ලද්දේ රු. 3000/-ක වාර්ෂික බලපත්‍ර දීර්ඝ කිරීමේ ගාස්තුවකට යටත්වයි.

කොළඹ - හම්බන්තොට මාර්ගය සඳහා ටෙන්ඩර් කැඳවීමක් මෙතෙක් සිදු කර නොමැති අතර දැනට ධාවනය වන බස් රථ සඳහා අවසර පත්‍ර ලබා දී ඇත්තේ පැරණි ක්‍රමය යටතේ රු: 3000/- ක වාර්ෂික බලපත්‍ර දීර්ඝ කිරීමේ ගාස්තුවකට යටත්වයි.

(ඉහත අමාත්‍ය මණ්ඩල තීරණයට පෙර ලබා දුන් අවසර පත්‍ර බැවින්)

(ආ) 2010 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, හම්බන්තොටද අනෙකුත් දිස්ත්‍රික්කවලද සිට යාපනය ඇතුළු යුද්ධයෙන් පීඩාවට පත් සෙසු ප්‍රදේශ වෙත නිකුත් කර ඇති මගී සේවා අවසර පත්‍රයක ගාස්තුව රු. 700,000/- (අර්ධ සුඛෝපභෝගී) හා රු. 11,000,000/- (අධි සුඛෝපභෝගී/සුඛෝපභෝගී) වේ.

එසේම දිවයින පුරා සෙසු මාර්ග සඳහා ද මගී සේවා අවසර පත්‍ර ලබා දීමේදී ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් අනුගමනය කරනු ලබන්නේ ටෙන්ඩර් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා ඉහළම මිල ගණන් ඉදිරිපත් කළ පුද්ගලයන්ට මගී සේවා අවසර පත්‍ර ලබා දීමේ ක්‍රමවේදයයි.

(ඇ) අදාළ නොවේ.

## අගලවත්ත ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය: බඳවා ගත් සේවකයන්

அகலவத்த தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிலையம் : சேர்த்துக்கொள்ளப்பட்ட ஊழியர்கள்

AGALAWATTA NATIONAL INSTITUTE OF LANGUAGE EDUCATION AND TRAINING : EMPLOYEES RECRUITED

2709/'12

11. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக )

(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා අගලවත්ත ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයට බඳවා ගන්නා ලද සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සේවකයා බඳවා ගත් දිනය හා ඔවුන්ගේ අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන් බඳවා ගන්නා ලද ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තනතුරු සඳහා නුසුදුස්සන් බඳවා ගෙන ඇති බවට එහි සේවකයන් චෝදනා කරන බව දන්නේද;

(ii) එම චෝදනා පරිදි නුසුදුසු පුද්ගලයන් හට පත්වීම් ලබා දී ඇත්නම්, ඔවුන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2005ஆம் ஆண்டு தொடக்கம் இதுவரை அகலவத்த தேசிய மொழிக் கல்வி மற்றும் பயிற்சி நிலையத்திற்குச் சேர்த்துக்கொள்ளப்பட்ட ஊழியர்களின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு ஊழியரும் சேர்த்துக் கொள்ளப்பட்ட திகதி மற்றும் அவர்களது கல்வித் தகைமைகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) அவர்கள் சேர்த்துக்கொள்ளப்பட்ட விதிமுறை யாது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) (i) மேற்கூறிய பதவிகளுக்கு தகைமையற்றவர்கள் சேர்த்துக்கொள்ளப்பட்டுள்ளதாக அங்குள்ள ஊழியர்கள் குற்றம் சாட்டுகின்றார்கள் என்பதையும்;

(ii) அந்த குற்றச்சாட்டுகளின்படி தகமையற்றவர் களுக்கு நியமனங்கள் வழங்கப்பட்டிருப்பின் அவர்களை நீக்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

( இ) இன்றேல், ஏன்?

asked the Minister of National Languages and Social Integration:

(a) Will he inform this House -

(i) of the number of employees who have been recruited to the Agalawatta National Institute of Language Education and Training from the year 2005 up to now;

(ii) separately, of the date on which each of the aforesaid employee was recruited and their education and other qualifications; and

(iii) the scheme of recruitment adopted to recruit them?

(b) Will he inform this House -

(i) whether he is aware that the employees in the aforesaid institution allege that unsuitable persons have been recruited to the aforesaid posts; and

(ii) whether action will be taken to remove unsuitable persons if appointments have been given to such persons as per the said allegations?

(c) If not, why?

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**

(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) 2007 වර්ෂයේදී අංක 26 දරණ පනත මගින් ස්ථාපිත කරන ලද ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ 2007 සිට 2013 දක්වා වර්ෂයන්හිදී සේවකයින් ආයතනයට බඳවා ගැනීම් සිදු කර ඇත.

බඳවාගත් මුළු සංඛ්‍යාව - 36

දැනට සේවයේ සිටින සංඛ්‍යාව - 22

(ii)

| | නම | තනතුර | බඳවා ගත් දිනය | ඉවත් වූ දිනය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රසාත් ආර් හේරත් මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2008-08-01 | දැනට සේවයේ ඇත | පශ්චාත් උපාධිය |
| 02 | ජානක ආර් හේවාසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ | 2008-08-01 | 2010-02-02 | උපාධිය |
| 03 | කේ රණවීර මහතා | ගණකාධිකාරී | 2008-08-01 | 2010-08-31 | උපාධිය |
| 04 | චන්ද්‍රා විමලවීර මිය | පරිපාලන නි[illegible]ධාරිනී | 2008-08-01 | 2011-08-27 | අ.පො.ස (උසස් පෙළ) |
| 05 | රසාංගි කලුආරච්චි මිය | මූල්‍ය සහකාර | 2008-08-15 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 06 | නිම්මි දේශප්‍රිය මෙනවිය | පුස්තකාලයාධිපති | 2009-10-11 | 2011-08-07 | අ.පො.ස (උසස් පෙළ) |
| 07 | නිමේෂා ඉඳුනිල් මිය | පිළිගැනීමේ නිලධාරිනී | 2008-11-26 | 2012-04-03 | අ.පො.ස (උසස් පෙළ) |
| 08 | නදී රශිකා මිය | නේවාසිකාගාර පාලිකා | 2008-08-16 | 2012-08-15 | උපාධිය |
| 09 | සඳමාලි රාජපක්ෂ මිය | කළමනාකරණ සහකාර | 2008-08-15 | 2011-01-03 | අ.පො.ස (උසස් පෙළ) |
| 10 | හිරෝශිමා පෙරේරා මිය | කළමනාකරණ සහකාර | 2008-11-26 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 11 | මධුකා තරංගනී මෙනවිය | කළමනාකරණ සහකාර | 2008-09-22 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 12 | නිරෝෂන් පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | 2008-11-03 | 2012-04-07 | අ.පො.ස (උසස් පෙළ) |
| 13 | පාලිත පත්ම කුමාර මහතා | විදුලි කාර්මික හා පොම්ප ක්‍රියාකරු | 2008-08-15 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | ලිල් ප්‍රභාත් මහතා | රියදුරු | 2008-09-22 | දැනට සේවය අත්හිටුවා ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 15 | ආනන්ද විජේසිරි මහතා | රියදුරු | 2008-09-22 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 16 | සාගර රණසිංහ මහතා | රියදුරු | 2008-09-22 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 17 | කේ ඩී රණවීර මහතා | රියදුරු | 2008-09-22 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 18 | ඩබ් ඒ සංජීව මහතා | කාර්යාල සහයක | 2008-09-25 | දැනට සේවයේ ඇත | අ.පො.ස (සා පෙළ) |
| 19 | සුපුන් අත්තනායක මහතා | කාර්යාල සහයක | 2008-09-22 | දැනට සේවයේ ඇත | අ.පො.ස (සා පෙළ) |
| 20 | මංජුල රණසිංහ මහතා | ගණකාධිකාරී | 2010-02-03 | 2011-09-29 | උපාධිය |
| 21 | චමිලා පෙරේරා මිය | පුස්තකාලයාධිපති | 2011-03-21 | 2011-11-30 | අ.පො.ස (උසස් පෙළ) |
| 22 | දක්ෂා සුගතපාල මිය | කළමනාකරණ සහකාර | 2011-05-02 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 23 | පුෂ්පා ජයසිංහ මෙනවිය | කළමනාකරණ සහකාර | 2011-05-02 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 24 | මාලිංග පෙරේරා මහතා | රියදුරු | 2011-05-02 | දැනට සේවයේ ඇත | අ.පො.ස (උසස් පෙළ) |
| 25 | ප්‍රදීප් නිශාන්ත දිසානායක මහතා | ගණකාධිකාරී | 2011-10-14 | 2012-04-01 | උපාධිය |
| 26 | ආර් ඒ කේ එම් නාපාවල මිය | පරිපාලන නිලධාරිනී | 2011-10-17 | දැනට සේවයේ ඇත | උපාධිය |
| 27 | රවීන්ද්‍ර කරුණාරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ | 2012-01-02 | දැනට සේවයේ ඇත | උපාධිය |
| 28 | පී ගෝපිනාත් මහතා | සහකාර අධ්‍යක්ෂ | 2012-01-02 | දැනට සේවයේ ඇත | උපාධිය |
| 29 | කේ ඒ අයි කුඩලිගම මහතා | සහකාර අධ්‍යක්ෂ | 2012-01-17 | 2012-11-01 | උපාධිය |
| 30 | නිම්මි දේශප්‍රිය මෙනවිය | අධ්‍යයන හා පර්යේෂණ නි. ධාරී | 2012-01-15 | දැනට සේවයේ ඇත | පශ්චාත් උපාධිය |
| 31 | සමීරා දයාරත්න මිය | අධ්‍යයන හා පර්යේෂණ නි. ධාරී | 2012-03-26 | 2012-09-27 | උපාධිය |
| 32 | මොහොමඩ් ෆිර්තවුස් මහතා | අධ්‍යයන හා පර්යේෂණ නි. ධාරී | 2012-03-21 | දැනට සේවයේ ඇත | උපාධිය |
| 33 | කේ.එච්. සමන්ති මිය | ගණකාධිකාරී | 2012-04-23 | දැනට සේවයේ ඇත | උපාධිය |
| 34 | ප්‍රශාන් වික්‍රමසිංහ මහතා | සහකාර අධ්‍යක්ෂ | 2013-05-02 | දැනට සේවයේ ඇත | පශ්චාත් උපාධිය |
| 35 | දිළිනි ජයවර්ධන මිය | අධ්‍යයන හා පර්යේෂණ නි. ධාරී | 2013-05-06 | දැනට සේවයේ ඇත | පශ්චාත් උපාධිය |
| 36 | සිසිර සේනාතිලක මහතා | අධ්‍යක්ෂ | 2013-06-03 | දැනට සේවයේ ඇත | පශ්චාත් උපාධිය |

(iii) සියලුම තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුවත් පත් දැන්වීමක් පළ කිරීමෙන් පසු ලැබුණු අයදුම් පත් අතරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් අනතුරුව තෝරා ගැනීම් සිදු කර ඇත.

(ආ) (i) නැත.

(ii) නැත.

(ඇ) අදාළ නොවේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15 - 3515/'13 - (1), ගරු වසන්ත අලුවිහාරේ මහතා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු වසන්ත අලුවිහාරේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 2.30ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2013 ජුනි 6 දින ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් විකාශය කරන ලද වැඩසටහන
### 2013 யூன் 6ஆந் திகதி இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம் ஒலிபரப்பிய நிகழ்ச்சி
### PROGRAMME AIRED BY SRI LANKA BROADCASTING CORPORATION ON 6TH JUNE 2013

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අනුර දිසානායක මහතා විසින් තමන්ගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2013 ජූනි මස 19 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, ස්ථාවර නියෝග අංක 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
## அபிமானி சமூக அபிவிருத்தி மற்றும் கலாசார மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
## ABHIMANI SOCIAL DEVELOPMENT AND CULTURAL FOUNDATION (INCORPORATION) BILL

***දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "අභිමානී සමාජ සංවර්ධන හා අධ්‍යාපන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය"යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදින්, 48 (3) ස්ථාවර නියෝගය යටතේ, ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.***

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 48(3)இன்படி நிலைக்குழு "ஏ" க்கு பிரதிச் சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY SPEAKER *to Standing Committee"A" under Standing Order 48(3).*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ආපදා කළමනාකරණ හැකියාව වැඩි දියුණු කිරීම
## அனர்த்த முகாமைத்துவ ஆற்றலை மேம்படுத்தல்
## ENHANCEMENT OF DISASTER MANAGEMENT CAPACITY

**[අ.භා. 2.18]**

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"මෑත කාලීනව ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපවලට බලපෑ කුණාටු සහිත කාලගුණික තත්ත්වය විසින් සමස්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ හැකියාව ප්‍රමාණවත් නොවන බව මතු කර පෙන්වා ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවාසනාවන්ත මරණ ගණනාවක් සිදු විය.
මෙම තත්ත්වයන් තුළ,

1. නවීන තාක්ෂණික දියුණුව හා අනුගතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ හා අනිකුත් ආයතනවල පවත්නා උපකරණ වැඩිදියුණු කිරීමට;

2. වඩා උසස් මට්ටමේ ප්‍රාගුණ්‍යයක් අත් පත් කර ගැනීම සඳහා මෙම ආයතනවල පුද්ගලයන් පුහුණු කිරීමට;

3. බලපෑමට ලක් විය හැකි අය හට නිසි කලට අනතුරු ඇඟවීම් ලබා දිය හැකි වනු පිණිස මෙම ආයතන, කාලගුණික වෙනස්කම් මඟින් බල පෑමට ලක් විය හැකි ධීවර හා අනිකුත් අංශ සමඟ සම්බන්ධ කරන්නා වූ ක්‍රම පද්ධතීන් පිහිටුවීමට,

සුදුසු පියවරක් ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රධාන වශයෙන්ම මම මේ යෝජනාව ඉදිරිපත් කරන්න හේතු වුණේ, පසු ගිය මාස කීපය තුළ අවස්ථා කීපයකදී ඇති වූ හදිසි ආපදා තත්ත්ව හේතුකොටගෙන, මුහුදුකරයේ ජීවත් වුණු ජනතාවට මුහුණ පාන්නට සිදු වුණු බරපතළ ආපදා තත්ත්වයයි.

විශේෂයෙන්ම ජූනි මාසයේ අටවැනි දා දකුණු මුහුදු තීරයේ ඇති වුණු ආපදා තත්ත්වය හේතුකොටගෙන ජීවිත 54ක් නැති වුණා; අතුරුදහන්වීම් 17ක් වාර්තා වුණා. ඒ වාගේම ධීවර යාත්‍රා 30කට වැඩි ගණනකටත්, නිවාස ඇතුළු දේපොළ විශාල ප්‍රමාණයකටත් අලාභ හානි සිදු වුණා. ඒ අලාභ හානි සිදු වුණු අවස්ථාවේදී ක්‍රියා කරපු අන්දම සහ ඉන් පස්සේ ඒ ජනතාවට ලැබුණු ආධාර, උපකාර, සහන දිහා බැලුවාම කිසිම විධියකින් ඒ ගැන සෑහීමකට පත් වන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, මේ තත්ත්වයට මුහුණ දෙන අවස්ථාවේ විවිධ වාද විවාද ඇති වන්න පටන් ගත්තා. ප්‍රධාන කාරණය තමයි, ජූනි අටවැනි දා ඇති වුණු ඒ හදිසි ආපදා තත්ත්වය පිළිබඳව වග කිව යුත්තන් අතර එකඟතාවක් නොතිබීම. එක පැත්තකින් ආපදා කළමනාකරණ ඇමතිතුමා කියනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තිබෙන්නේ මුහුදු යෑම පිළිබඳව අනාවැකි පළ කිරීම නොවෙයි කියලා. අනෙක් පැත්තෙන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමා කියනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තිබෙන්නේ නිවේදන නිකුත් කර කර ඉන්න එක නොවෙයි කියලා.

කොහොම වුණත් අවසානයේදී වුණේ ධීවර ජීවිත 54ක් අහිමි වීමයි, ඒ වාගේම 17 දෙනෙක් අතුරුදහන්වීමයි, දේපොළ හානි සිදු වීමයි. මේ නිසා අද විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි අද අපේ අනාවැකි පළ කරන්නට තිබෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව බරපතළ අඩු පාඩුකම් රාශියකට, ඒ වාගේම නවීන තාක්ෂණික උපකරණ නොමැතිකම් වාගේ ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා තිබීම. විශේෂයෙන්ම නිලධාරින්ගේ පුහුණුව සහ දැනුවත්කම පිළිබඳව ගැටලු ගණනාවක් තිබෙනවා.

[ගරු තිස්ස අත්තනායක මහතා]

මම දැක්කා, පසු ගිය දවස්වල අවස්ථා කිහිපයකදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කරලා තිබෙන ප්‍රකාශ කිහිපයක්. ඒ අනුව දැනටමත් මේ දෙපාර්තමේන්තුවේ විශේෂඥයන්ගේ විශාල අඩුවක් තිබෙනවා. ඒ වාගේම ඇමතිතුමා නිතර නිතර ප්‍රකාශ කළා, "උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 1,700ක් ඉල්ලා තිබෙනවා, ඒවා අනාගතයේදී ලැබෙයි, තවමත් ලැබිලා නැහැ" කියලා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ඕනෑම රටක ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ඉතාමත් වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ජනතාවගේ ආරක්ෂාව වෙනුවෙන් ක්‍රියා කරන ආයතනයක්. මේක පැත්තකට දාලා, කොන් කරලා තියලා, නොවැදගත් හැටියට සලකලා ක්‍රියා කරන්න පුළුවන් ආයතනයක් නොවෙයි. මොකද, ජන ජීවිතය සුරක්ෂිත කිරීමට, ජන ජීවිතය ආරක්ෂා කිරීමට සහ ඒ පිළිබඳව අනාගත ක්‍රියාමාර්ග ගැනීමට තිබෙන ප්‍රධානම අමාත්‍යාංශයක වග කීමක් තමයි මේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ තිබෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට තිබෙන්නේ. එහෙම බලපුවාම මේ දෙපාර්තමේන්තුව ඒ අවශ්‍යතාවන් වෙනුවෙන් කිසිම ප්‍රමුඛතාවක් දීලා නැහැ කියන එකයි අපට පෙනෙන්නේ.

මට මතක හැටියට, මීට පෙර 2011 නොවැම්බර් මාසයේත් මෙවැනිම ආපදාවකට ලක් වුණා. ඒ වෙලාවේ ජීවිත විසි ගණනක් නැති වුණා. ඒ ජීවිත විසි ගණනක් නැති වුණාට පස්සේ අදාළ වග කිව යුත්තන් කිව්වේ මොකක්ද, ඒ අදාළ විෂය භාර ඇමතිවරුන් කිව්වේ මොකක්ද? ඒ අය කළේ නැති වුණු හැම ජීවිතයක්ම රුපියල් ලක්ෂයකට වටිනාකම තක්සේරු කරලා, ඒ නැති වුණු ජීවිතයකට රුපියල් ලක්ෂයක වන්දියක් ලබා දීමයි. ඒ අවස්ථාවේදී කිව්වා, විශේෂයෙන් මෙවැනි තත්ත්වයන් අනාගතයේ ඇති නොවන්න අනාවැකි පළ කිරීම සඳහා තාක්ෂණික වැඩ පිළිවෙළ දියුණු කරන්නට ක්‍රියා කරනවා කියලා. තවමත් ඒ අනතුරු ඇඟවීම් සංඥා පද්ධති සවි කරලා නැහැ. ඒ ගැන ගත්ත ක්‍රියාමාර්ගය තවමත් දුර්වලයි. ඉතින් ඒ වේලාවේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන ඇමතිතුමාත් විශේෂයෙන්ම පොරොන්දු වුණා, Vessel Monitoring System එකක් - VMS එකක්- හදනවා කියලා.

හැබැයි අද වන තුරුත් එවැනි ක්‍රියා මාර්ගයක් ගෙන නැහැ. නමුත් 2011 වූ ඒ සිද්ධිය අවස්ථාවක් කරගෙන, ප්‍රයෝජනයට අරගෙන, VMS පද්ධතියක් සවි කරන්න පුළුවන්කම යම් විධියකින් තිබුණා නම්, මේ අවුරුද්දේ ජුනි මාසයේ ඇති වූ සිද්ධිය වළක්වා ගැනීමට ඕනෑ තරම් කාල වේලාව තිබුණා කියා මම හිතනවා. මේ සම්බන්ධයෙන් ක්‍රියා කරපු ආකාරය ඉතාම දුර්වලයි. දුර්වලයි කියලා කියන්නේ ඇයි? ඒ ගැන අවධානය යොමු කළේ නැහැ. මුදල් ලබා දෙන්න ක්‍රියා කරලා නැහැ. මේ පද්ධතිය නවීකරණය කිරීම සඳහා සහ නවීන තාක්ෂණික උපකරණ ලබා දීලා මේ ආයතනය ජන ජීවිතයට වඩාත් සමීප සහ අවශ්‍යම ආයතනයක් හැටියට වැඩිදියුණු කිරීම සඳහා ගත්තු ක්‍රියා මාර්ග ඉතාම දුර්වලයි. ඒ නිසා තමයි මේ සිද්ධියෙන් මේ ජුනි මාසයේ 08වැනි දා ජීවිත 54ක් මේ රටට අහිමි වුණේ කියන එක විශේෂයෙන් පෙන්වා දෙන්න කැමැතියි. සමස්ත ලංකා පොදු ධීවර සමිතිය කියනවා, ඒ ජීවිත සඳහා මීට වඩා වන්දි මුදලක් ලබා දෙන්න වුවමනායි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිය ගිය ධීවරයකුගේ වටිනාකම රුපියල් ලක්ෂයක් ලෙස නියම කරලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා**
(மாண்புமிகு எம். ஜோசப் மைக்கல் பெரேரா)
(The Hon. M. Joseph Michael Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ගයන්ත කරුණාතිලක මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. GAYANTHA KARUNATILEKA *took the Chair.*

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජීවිතය අහිමි වූ ධීවරයකුගේ වටිනාකම රුපියල් ලක්ෂයකට සීමා කරලා, එතැනින් ඒ කටයුත්ත අවසන් කරලා තිබෙනවා. කාට හරි කියන්න පුළුවන්කමක් නැහැ, "නැහැ, එහෙම නොවෙයි. මේ ධීවරයන්ට තවත් සහන සලසනවා." කියලා. මොකද, එවැනි සහනයක් සලසලා නැහැ. 2011 නොවැම්බර් මාසයේදී මෙවැනිම සිද්ධියක් ඇති වූ වෙලාවේ ඒ ධීවරයන් වෙනුවෙන් ලබා දුන් සහනය රුපියල් 100,000කින් අවසන් කරලා තිබෙනවා. ඒක තමයි ඉතිහාසයේ ඇත්ත තත්ත්වය. සමස්ත ලංකා පොදු ධීවර සමිති සම්මේලනයත් මේ ගැන විශේෂයෙන් අදහස් දක්වා තිබෙනවා. අපේ අදහස නම්, මිය ගිය හැම ධීවරයකු වෙනුවෙන්ම අඩු ගණනේ රුපියල් ලක්ෂ 20ක වන්දියක් ගෙවන්න ඕනෑ කියන එකයි. මොකද, ඒ පවුල්වල, ධීවර ව්‍යාපාරයේ යෙදුණු, ධීවර ජීවිකාව කරපු ප්‍රධානියා තමයි නැති වුණේ. ඒ පවුල් වෙනුවෙන් හරි හම්බ කරන්න, ආදායමක් ගන්න ගිය ප්‍රධානියා තමයි නැති වුණේ. එහෙම නම් ඒ අය වෙනුවෙන් මේ තක්සේරුව, වන්දිය කිසිසේත් ප්‍රමාණවත් නැහැ. අඩු ගණනේ රුපියල් ලක්ෂ 20ක වන්දියක් ගෙවිය යුතුයි කියන කාරණය මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය මේකයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට, එහෙම නැත්නම් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට මේ මුදල් ටික දෙන්න මේ තරම් ප්‍රමාද ඇයි? එක වතාවක් කියලා තිබුණා විදේශ ආධාර අරගෙන, ඒ විදේශ ආධාර මඟින් මේ ආයතනය නවීකරණය කරන්න, තාක්ෂණික උපකරණ ලබා දෙන්න, ඒ වාගේම මෙය යාවත්කාලීන කරන්න ක්‍රියා කරනවා කියලා.

හැබැයි පසු ගිය අවුරුදු තුන, හතරේදීම මේ සම්බන්ධයෙන් මුදල් ඉල්ලනවා. එතකොට මුදල් ලැබෙන්න තිබෙනවාය කියනවා, ජාත්‍යන්තර ආධාර ගන්න සාකච්ඡා කර තිබෙනවාය කියනවා. නමුත් ප්‍රශ්නය විසඳුණේ නැහැ. 2011 සිද්ධියෙන් පස්සේ

2013 ජූනි මාසයේ නැවතත් මෙවැනිම සිද්ධියක් ඇති වන තුරුත් මේ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියා මාර්ගයක් නැහැ. මා අහන්නේ, මේකට ප්‍රමුඛතාව දෙන්නේ නැත්තේ ඇයි කියලායි. දැන් බලන්න, night races වලට කොපමණ මුදල් වියදම් කරනවාද කියලා. රුපියල් කෝටි ගණන් මුදල් වියදම් කරනවා.

ඒ විතරක් නොවෙයි. පසු ගිය කාලයේ ශ්‍රී ලන්කන් ගුවන් සේවය වැනි ආයතන නඩත්තු කර ගෙන යන්න රුපියල් බිලියන 20ක් ගෙවා තිබෙනවා. 2012 ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ මෙහෙයුම් අලාභය විතරක් රුපියල් කෝටි 100යි. භාණ්ඩාගාරය කිසිම ආකාරයක ප්‍රමාදයක් නැතුව ඒ රුපියල් කෝටි 100 ගෙවා තිබෙනවා. හැබැයි ධීවරයන්ගේ අනාගත ආරක්ෂාව සඳහා අවශ්‍ය උපකරණ ලබා ගන්න ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට හෝ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට සල්ලි දෙන්න මේ තරම් මැළිකමක් දක්වන්නේ ඇයි කියන එක අපි අහන්න ඕනෑ.

අනික් එක, බලපිටිය, බේරුවල, මොරටුව හා ඒ ආසන්න ප්‍රදේශවල ධීවර ප්‍රජාවගේ ඒ මළ ගෙවල්වලට ගියාම මොකක්ද ඒ අය කිව්වේ? ඒ අය කරන්නේ බරපතළ චෝදනාවක්. එම චෝදනාව තමයි, ඒ අයට නියම වෙලාවට, කලට වේලාවට මේ තොරතුරු ලබා දුන්නේ නැහැයි කියන එක.

විශේෂයෙන්ම මේ පිළිබඳව කඹ ඇදිල්ලක් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයත්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත් අතර තිබුණා. අපි ඒක දැක්කා. ඒ අය තරගයට වාද විවාද කර ගන්න පටන් ගත්තා. මොකක්ද මේ සිද්ධ වුණේ? මෙම ආපදාව පිළිබඳව ජාත්‍යන්තර පැසිෆික් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ලබා දුන්නු තොරතුර අඩු ගණනේ මේ රටේ ධීවරයින් දැනුවත් කරන්න නැවත වතාවක් පාවිච්චි කරලා තිබුණේ නැහැ. ඒ වාගේම අපේ ධීවරයන් වෙනුවෙන් මේ පණිවුඩය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිකුත් කළාය කිව්වත්, ඒ නිකුත් කළ පණිවුඩය මාධ්‍ය හරහා මෙම ධීවරයන් යළි දැනුවත් කරන්න ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ක්‍රියා කර තිබුණාද කියන බරපතළ ප්‍රශ්නය තිබෙනවා.

දැන් මේ සියල්ලම අමතක කරලා ධීවරයන්ගේ වරදින් තමයි මෙය සිද්ධ වුණේ කියලා කියන්න උත්සාහ කර තිබුණාය කියන එක පසු ගිය කාලයේදී අපි දැක්කා. මොකක්ද? ආණ්ඩුවේ සමහර බලධාරින් ප්‍රකාශ කරන විධියට මෙම ධීවරයන් මරණයට පත් වුණේ, ඔවුන් ආරක්ෂිත කබා පැළඳ ගෙන නොසිටීම නිසාය කියා චෝදනා කරමින් දැන් ධීවරයා පිටම එම වරද පටවමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහනවා, මේ ආරක්ෂිත කබා සෑම ධීවරයකුටම නියමිත පරිදි ලබා දීලා තිබෙනවාද කියලා. විශේෂයෙන්ම හානියට පත් වුණු ධීවරයකු වන බලපිටියේ ජී. නිමලසිරි මහතා පුවත් පතකට කර තිබෙන ප්‍රකාශයක් මා දැක්කා. එතුමා කියනවා, "අපි මුහුදු ගියේ සිකුරාදා සවස 5.00 ට විතර. වෙන දා වාගේ තමයි, මුහුද රළු බවක් තිබුණේ නැහැ. හොඳ කාලගුණයක් තිබුණා. කිසිම බියක් ඇති කර ගන්නට තරම් වෙනසක් දැක්කේ නැහැ. ඒකයි- [බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised.
ගරු අස්වර් මන්ත්‍රීතමා point of Order එක ඉක්මනට කියන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, it is the duty of the Opposition to maintain the Quorum because an Hon. Member from the Opposition has moved the Adjournment Motion. There is no Quorum in the House; it is their duty to maintain the Quorum. Sir, there is no Quorum. ඒක කරන්න ඕනෑ.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
Why?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
"Why" කියා කියන්නේ. ඔයගොල්ලන්ගෙයි Adjournment Motion එක. ඇයි මන්ත්‍රීවරු ගෙන්වා ගන්න බැරි? Sir, there is no Quorum. Quorum bell එක ගහන්න.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මේවා කියනකොට රිදෙනවා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
රිදෙනවා නොවෙයි. ඒකේ පිළිවෙළක් තිබෙනවා. තමුන්නාන්සේට ඕවා කියා දෙන්න ඕනෑ. -[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Yes, Hon. Ravi Karunanayake.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Mr. Presiding Member, the Hon. Azwer is not a member of the Committee on Parliamentary Business. At that particular Party Leaders' Meeting there was a request made by the Government about this - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order. No one can talk now and you have to expunge whatever he said, Sir. When an Hon. Member raises a question on Quorum, no one has the right to speak.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
Adjournment Motion එකට ඕනෑ ද Quorum? Adjournment Motion එකට ඕනෑ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
During an Adjournment debate, there is no need of a Quorum. - [*Interruption.*]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
අවශ්‍ය නැහැ. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
අවශ්‍ය නැහැ නේ. [බාධා කිරීමක්] විවාදය පවත්වමු. [බාධා කිරීමක්] මේක අත්‍යවශ්‍යයි. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම කනගාටු වෙන්න ඕනෑ. මේ කථා කරන්නේ අහිංසක ධීවර ජනතාවගේ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයට අනාගතයේ විසඳුම් සොයන්න මේ වාගේ විවාදයක් අර ගෙන කථා කරනකොට මේ කථා කරන දේත් වළක්වන්න හදනවා නම්, මේ ගරු සභාවේ ඉන්නේ මොන තරම් මහජන සේවකයෝද කියා අපට බලා ගන්න පුළුවන්. [බාධා කිරීමක්] පුත්තලමේ ඉන්නේ. පුත්තලමේ ධීවර ජනතාව ගැන වචනයක් කථා කරනවා ද? එම නිසා ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මා ඒ ගැන කථා කරන්නේ නැහැ. මා කියාගෙන ආවේ මෙයයි. ජී. නිමල්සිරි මහතා -[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, there is no Quorum. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ රීති ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.[බාධා කිරීමක්]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ස්ථාවර නියෝගවලට අනුව කටයුතු කරන්න ඕනෑ, පාර්ලිමේන්තුව. [*Interruption.*] Quorum එක 20 Members විය යුතුය කියා ස්ථාවර නියෝගවල ඉතාමත් clearly mention වෙනවා.

ඕනෑම වෙලාවක ඕනෑම Hon. Member කෙනෙකුට Quorum එක නැහැයි කියා ඒ ප්‍රශ්නය නහන්නට පුළුවන්. So, I have the right to raise this issue, Sir, and you have to give the verdict according to the Standing Orders. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට මගේ තීරණය දුන්නා. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි මා කියමින් සිටියේ මෙයයි. මේ කියන්නේ, ජී. නිමල්සිරි මහතා බලපිටිය. "අප මුහුදු ගියේ සිකුරාදා සවස 5.00ට විතර. වෙන දා වාගේ තමයි, මුහුද රළු බවක් තිබුණේ නැහැ.-[බාධා කිරීමක්] - හොඳ කාලගුණයක් තිබුණා. කිසිම බියක් ඇති කර ගන්න තරම් වෙනසක් දැක්කේ නැහැ. ඒකයි අප මුහුදු ගියේ. අප යන්න කලින් හැම දාම කාලගුණ වාර්තාව අහනවා.- [බාධා කිරීම්] එහෙම තමයි මුහුදු ගියේ. මගේ මුළු ජීවිත කාලයේම දැකපු නැති තරම් මහා භයංකාර සුළි සුළං කුණාටුවක් දියඹේ ඇති වුණා.

ඒක පටන් ගත්තා විතරයි අප දැල් දාලා තිබුණු ඒවා එහෙම තියෙද්දී බෝට්ටු අරන් රෑ එක වන විට ගොඩ බිමට ආවා. එහෙම නොවෙන්න අපට මොනවාද වෙන්නේ කියලා කියන්න දන්නේ නැහැ. මුහුදට වැටුණොත් බේරෙන්න පුළුවන්. ආරක්ෂිත ජැකට් කළුතර, බේරුවල පැත්තේ ධීවරයන්ට තිබෙනවා. බෙන්තර ගඟෙන් එහාට ඒවා නොදෙන්නේ ඇයි කියලා ධීවර ඇමතිතුමා හොයලා බැලුවොත් තමයි හොඳ. එහෙම වුණා නම් ජීවිත ගොඩක් බේරා ගන්න තිබුණා."

මෙහෙම කියන්නේ කවුද? ඒ ආපදාවට මුහුණ දුන්න ධීවරයෙක්. අප කියන්නේ මෙයයි. ධීවරයන්ට දොස් කිය කියා ඉඳලා වැඩක් නැහැ. මේ ධීවරයන්ට අවශ්‍ය ආරක්ෂිත කබා නියමිත පරිදි දුන්නේ නැහැ. තව කාරණයක් කියන්න තිබෙනවා. ධීවරයන්ට ආරක්ෂිත කබා නිකුත් කර තිබුණු ප්‍රදේශවල පවා එක බෝට්ටුවකට එක ධීවර කබායයි දීලා තිබුණේ. සාමාන්‍යයෙන් අප දන්නවා එක බෝට්ටුවක ධීවරයන් තුන් හතර දෙනෙක් යන බව. එතකොට එයින් එක් කෙනෙකුට විතරයි ජීවිතාරක්ෂක කබා දෙන්නේ. අනික් කාටවත් ඒවා දීලා නැහැ. අප කියන්නේ, "ඒවා සල්ලිවලට ගන්න" කියලා මේ ධීවරයන්ට නියම කරන එක හරි නැහැ කියලායි. ඒ අයට ඒ කබා දෙන්න තිබුණා. නොයෙකුත් නාස්තිකාර වියදම් මේ ආණ්ඩුවෙන් ඕනෑ තරම් කරනවා. මේ ආණ්ඩුවෙන් ඒ නාස්තිකාර ලෙස වියදම් කරන සල්ලි ටිකක් ඉතුරු කරලා හරි මේ ධීවරයන්ට ආරක්ෂිත කබා ටිකක් දීලා ඔවුන්ගේ ජීවිත බේරා ගන්න තිබුණා. ඒකත් කරලා තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනික් කාරණය මෙයයි. බලන්න මේ සිද්ධිය වුණු වෙලාවේ මේ අය හැසිරුණේ කොහොමද කියලා. මේ සිද්ධිය ඇති වුණේ 7වැනි දා රෑ. මේ ආපදාවට ලක් වුණු ධීවර ජනතාව මේ බවක් දන්නේ නැතිවයි මුහුදට ගොස් තිබුණේ. මේ සිද්ධිය ඇති වුණාය කියලා 8වැනි දා හැමෝම දැන ගෙන තියෙද්දීත්, අඩු ගණනේ මේ අයගේ ජීවිත බේරා ගන්න 8වැනි දා දහවල් වන තුරු ආණ්ඩුවේ හෙලිකොප්ටර් යානා යොදවා තිබුණේ නැහැ. හවස් වරුවේ තමයි ඒවා ආවේ. දෙහිවල පැත්තේ ඇති වුණු උද්ඝෝෂණයක් හේතුවෙන් තමයි නැවත මේකට අවධානය යොමු කරන්න පටන් ගත්තේ. එදා රාත්‍රියේ සිටම මේ වෙනුවෙන් නියමිත ආරක්ෂක විධිවිධාන යෙදුවා නම් මීට වඩා ධීවර ජීවිත ප්‍රමාණයක් බේරා ගන්න තිබුණා. සමහර ධීවරයන් කිව්වා මුහුදේ ඔවුන්ගේ බෝට්ටු අබලන් වෙලා තමන්ගේ ජීවිතයයි, මරණයයි අතර සටනක් කරමින් සිටින අවස්ථාවේදී කිසිම කෙනෙක් පිහිටට ආවේ නැහැ කියලා. ඔවුන්ට පිහිට වෙන්න පුළුවන්කම තිබෙන්නේ ආණ්ඩුවට විතරයි. හෙලිකොප්ටර් යානා ආදිය යොදවලා ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් යම් කිසි මෙහෙයුමක් කරන්න තිබුණා. එහෙත් 8වැනි දා දහවල් පසු වනතුරු මේ වෙනුවෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණේ නැහැ. සමහර අයට පෞද්ගලික හෙලිකොප්ටර් යානාත් තිබුණා. ඒවා යොදා ගත්තේත් නැහැ. ඒවා එක එක ආයතනවලට කුලියට දීලා තිබුණා. ජන ජීවිතයේ ආරක්ෂාව වෙනුවෙන් මේ හෙලිකොප්ටර් යානා යොදවන්න තිබුණා. එහෙම

කරලා තිබුණෙත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අවස්ථාවේදී ක්‍රියා කර තිබුණු අන්දම ගැන කිසිසේත් සෑහීමකට පත් වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ලෝකයේ හුඟක් රටවල් ආපදාවලදී ක්‍රියා කරන්නේ මේ විධියට නොවෙයි.

බලන්න, මාස කිහිපයකට ඉස්සර වෙලා ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නගරයේ මහා විශාල ආපදාවක් සිදු වුණා. හදිසි සුනාමි තත්ත්වයක් නිසා මුළු නිව්යෝර්ක් නගරයම වතුරෙන් යටවුණා. ඒ බලධාරීන් කළේ මොකක්ද? මේ සිද්ධිය ඇති වෙනකන් බලාගෙන සිටියේ නැහැ. මේ පිළිබඳව අනතුරු ඇඟවීම ලැබුණාම හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරලා ඒ ආපදා තත්ත්වය පිළිබඳව මහජනතාව දැනුවත් කරලා, ඔවුන් ආරක්ෂිත ස්ථානවලට යැවීම තමයි ඒ නිව්යෝර්ක් නගරයේ බලධාරීන් පළමුවෙන්ම කළේ. ඊළඟට ඔවුන් කළේ වතුරෙන් යට වියහැකි ස්ථානවලට අනතුරු අඟවලා ඒවායේ දේපොළවල ආරක්ෂාව සඳහා විධි විධාන යෙදීමයි. ඔවුන් තුන් වෙනුව කළේ, මේ ආපදාවට ලක්වන නිව්යෝර්ක් නගරයේ මහජනතාවට සහන සලසන්න යම් කිසි ක්‍රියා මාර්ගයන් ගැනීම සම්බන්ධයෙන් ඒ වෙනුවෙන් තිබෙන ආයතන සියල්ල දැනුවත් කරන්නට පියවර ගැනීමයි. හතර වෙනුව කළේ මොකක්ද? හතර වෙනුව තමයි ඔවුන් වටිනා උපකරණ, දේපොළ ඉවත් කිරීම කළේ. ඔබතුමාත් දන්නවා ඇති, මුළු නිව්ර්යෝක් නගරයේම තිබෙන්නේ පොළව යට තිබෙන උමං මාර්ගවල දුම්රිය සේවාවන් බව. ඒක තමයි නිව්යෝර්ක් නගරයේ ප්‍රධානම ප්‍රවාහන පද්ධතිය. පොළොව යට තිබෙන මේ දුම්රිය සේවාව, ඒවායේ තිබෙන උපකරණ වහාම එතැනින් ඉවත් කරලා, මම හිතන විධියට කෝටි ගණනක දේපොළ නාස්ති වන්නට නොදී බේරා ගන්නට එදා ඔවුන්ට පුළුවන්කම ලැබුණා. ඉතින් මම කියන්නේ, ඊළඟ පියවරක් ගැන ඔවුන් කල්පනා කළේ ආපදාව එන්නත් ඉස්සර වෙලායි. ආපදා අවස්ථාවෙන් පසුව ප්‍රතිසංවිධාන වැඩ පිළිවෙළක් ඇති කරන්නේ කොහොමද කියන එකත් සැලසුම් කළා. ඒ වාගේ වගකීමක් ඇතිව ඔවුන් එදා ක්‍රියා කරපු නිසා නිව්යෝක් නගරයේ ජන ජීවිතය බේරා ගන්නත් පුළුවන්කම ලැබුණා; ඒ වාගේම දේපොළ ආරක්ෂා කර ගන්නටත් පුළුවන්කමත් ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඇති වුණු මෙම ආපදා අවස්ථාවේ දී ක්‍රියා කරපු ආකාරය ගැන අපට සෑහීමකට පත් වන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ නිශ්චිත පරිදි වගකීමකින් යුතුව ක්‍රියා නොකිරීම නිසාය කියන චෝදනාවෙන් ගැලවෙන්නට පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය තමයි මේ ඇති වූ ආපදා තත්ත්වයෙන් පසුව විපක්ෂ නායකතුමා බලපිටිය, බේරුවල, මොරටුව යන මේ ප්‍රදේශවල ආපදාවට මුහුණ දුන් ධීවර ජනතාව බලන්න ගියා. එම ධීවර ජනතාවගේ මරණ සිදුවුණු ගෙවල්වලට ගොඩවුණා. ඒ අයගේ දුක සැප බෙදා ගන්නට එතුමා සහභාගි වුණු එවැනි අවස්ථාවක ඇති වුණු තත්ත්වය මොකක්ද? ඒ අවස්ථාවේ දී ඉතාමත් කනගාටුදායක තත්ත්වයකට මුහුණ දෙන්නට එතුමාට සිදු වුණා. පසු ගිය 11වැනි දා විපක්ෂ නායකතුමා එම ධීවර ජනතාවගේ මරණ සිදුවුණු ගෙවල්වලට ගිහිල්ලා ඒ අයගේ දුක සැප බලා එන අතරතුර බලපිටියේ දී එතුමාගේ වාහනවලටත් හානි කරන්නට සමහර කණ්ඩායම් ක්‍රියා කළා. අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් දෙදෙනෙකු වන බලපිටිය ප්‍රාදේශීය සභාවේ අජිත් අසේල මහතාත්, එම්.ඩබ්ලිව්. සෙනරත් මහතාත් පහර දීමකට ලක්වෙලා ඔවුන්ට රෝහල් ගත වන්නට සිදු වුණා.

මෙහෙම මරණයක් වෙලා ඒ මරණය වෙලාවේදී දේශපාලනයකින් තොරව මේ විධියට ඔවුන්ගේ දුක බෙදා ගන්න විපක්ෂ නායකතුමාත්, එක්සත් ජාතික පක්ෂයේ ඒ සංවිධායකවරුන් හා මන්ත්‍රීවරුනුත් එදා සහභාගි වුණ වෙලාවේ මෙහෙම තමයි ආණ්ඩුවේ බලධාරින් හැසිරුණේ; මේ අයට උදවු උපකාර කරන්න නොවෙයි කටයුතු කළේ. විපක්ෂ නායකතුමාට විපක්ෂ නායකකම පැත්තකින් තියලා ඒ මළ ගෙවල්වල යන්න බැහැ. හැබැයි, මේ මරණ සියල්ල තමන් ඉදිරියේ තියා ගෙන ඔවුන් ඒ අවස්ථාවේදී හැසිරුණේ හරියට මැරයින් පිරිසක් හැසිරෙන ආකාරයටයි. ඒ නිසා අපි අහනවා, මේ සිද්ධිය ගැන කළ පරීක්ෂණය මොකක්ද කියලා. පොලිස්පතිතුමාට කිව්වා, පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරලා තිබෙනවා, මේ පිළිබඳව බලධාරින්ට පැමිණිලි කරලා තිබෙනවා. අද වනතුරු විපක්ෂ නායකතුමාගේ ඒ සිද්ධිය පිළිබඳව කිසිම පරීක්ෂණයක් සිදු කරලා නැහැයි කියන එක මම ඔබතුමාට සඳහන් කරන්නට කැමැතියි.

අද මේ පවතින තත්ත්වය ඉතාමත් නරකයි. නැවතත් අපි ඉල්ලනවා, මේ ආපදා කළමනාකරණ විෂයයත්, ඒ වාගේම ආපදා කළමනාකරණ අමාත්‍යාංශයත්, මේ සම්බන්ධයෙන් ප්‍රධාන වගකීම තිබෙන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත් වහා නවීකරණය කරන්න අවශ්‍ය පියවර ගන්න කියලා. මේ ආයතනය කුඩම්මාගේ සැලකිලි දක්වලා, මුල්ලකට තල්ලු කරලා, නොවැදගත් ආයතනයක් හැටියට පැත්තකට දමලා තියන්න පුළුවන් ආයතනක් නොවෙයි. මේකට ඕනෑ කරන යාවත්කාලීන කිරීම් ටික කරන්න වහාම ආණ්ඩුව විසින් පියවර ගත යුතුයි කියන කාරණය ප්‍රකාශ කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සිද්ධියෙන් මරණයට පත් වූ අයට රුපියල් ලක්ෂය ගණනේ වන්දියක් ගෙව්වා කියලාත්, ඒ වාගේම මරණය වෙලාවේදී රුපියල් 15,000ක මුදලක් ගෙව්වා කියලාත් මීට දවස් දෙක තුනකට ඉස්සර වෙලා මාධ්‍යවල පළ වෙලා තිබුණා මම දැක්කා. හැබැයි මෙතැනදී ප්‍රශ්නයක් මතු වෙනවා, මේ අයගේ පවුල් රක්ෂණය වෙලා තිබෙනවා නම් ඒ රක්ෂණ මුදල් ඒ පවුල්වලට ගෙව්වේ නැහැයි කියලා චෝදනාක් තිබෙනවා.ඒ වාගේම ආපදාවලට ලක් වුණු බෝට්ටුවලට, වෙනත් අලාභවලට කිසි වන්දියක් නැහැ. විශේෂයෙන්ම ඔවුනගේ ප්‍රධාන ජීවිකාවට උපයෝගී කර ගත්ත ඒ බෝට්ටු සහ ධීවර ආම්පන්නවලට වන්දි ගෙවීමට ආණ්ඩුවේ වගකීමක් හා යුතුකමක් තිබෙනවා කියන එක විශේෂයෙන්ම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් කාරණය, මේ වාගේ සිද්ධියක් ඇති වුණාම ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීම ඉතාමත් වැදගත්. ජූනි මාසයේ 08 වන දා මේ ආපදා තත්ත්වය පැමිණියාම ඇත්තටම ලංකාවේ ධීවරයන් දැනුවත් කරන්න ක්‍රියා කළේ නැහැ වාගේම සිද්ධිය ගැන දැනුවත් වුණාට පසුවවත් අඩු ගණනේ අසල්වැසි රටෙන් -ඉන්දියාවෙන්- සහාය ගන්නවත් උත්සාහ කළේ නැහැ. මොකද, ඉන්දියාවට තිබෙනවා, ඉතාම ශක්තිමත් වෙරළාරක්ෂක සේවාවක්. ඔවුන්ට තිබෙනවා, මෙවැනි අවස්ථාවක ක්‍රියා කරන්නට ඕනෑ උපකරණ. විශේෂයෙන්ම ඩෝනියර් යාත්‍රා තිබෙනවා. ඕනෑම ආපදා තත්ත්වයකදී මුහුදු ගිය ධීවරයින් හා හානියට පත් වන පුද්ගලයන් බේරා ගත හැකි නවීන යන්ත්‍රෝපකරණ මේ යාත්‍රාවල තිබෙනවා. අවශ්‍යතාව අනුව ඉල්ලුවා නම් මෙවැනි ආධාර උපකාර ලබා ගැනීමට සහාය දෙන්නට ඒ අය නිතරම බැඳිලා සිටිනවා. එහෙම නම්, මේ ගැන ක්‍රියා කරන්නවත් පියවර ගත්තේ නැහැ කියන චෝදනාව සියලු බලධාරින්ට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය දිහා බලපුවාම අපි හදිසියෙන්ම කළ යුතු කාර්යයක් තමයි මේ ගැන වහාම අවධානය යොමු කර ක්‍රියාත්මක වීම. පළමුවෙනි කාරණය හැටියට මම කියන්නේ අපට දැන් මේ සඳහා අත් දැකීම් තිබෙන බවයි. සුනාමියේ ඉඳලා වරින් වර වරින් වර අපට ලැබුණු අත් දැකීම් තිබෙනවා. සුනාමි ව්‍යසනය නිසා අපේ ජීවිත ලක්ෂ ගණනක් නැති වෙලා තිබෙනවා. ආපදා තත්ත්වයන්වලට මුහුණ දෙන්න අපි සූදානමක් නැති නිසා තමයි එහෙම වුණේ. ඒ විතරක් නොවෙයි. වරින් වර, වරින් වර ලංකාවේ විවිධ පළාත්වල ධීවර ජනතාවට, ඒ වාගේම ඒ ධීවර ප්‍රජාවගේ කටයුතුවලට නොයෙක්

[ගරු තිස්ස අත්තනායක මහතා]

බාධාවන් ඇති වෙලා ජීවිත දහස් ගණනක් නැති වෙලා තිබෙනවා. ධීවර ජනතාවට විතරක් නොවෙයි, ඇත්තටම අනාගතයේදී ගොඩබිම ජීවත් වන ජනතාවටත් ගංවතුර උවදුරු හා වෙනත් කාරණාවලදී ඔවුන්ගේ ආරක්ෂාව සඳහා සහ අනාගත ක්‍රියාමාර්ග සඳහා මෙවැනි දියුණු තාක්ෂණික තත්ත්වයන් භාවිත කරන්න ක්‍රියා කළ යුතුම වෙනවා. මොකද, ස්වාභාවික ව්‍යසනයන් එන්න එන්න වැඩි වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම යෝජනා කරන්නේ නැවත ආපදාවක් එනකම් බලා ඉන්නේ නැතිව මේ දෙපාර්තමේන්තුව වැඩිදියුණු කරන්න ක්ෂණික පියවර ගත යුතුයි කියලායි. නැවත ආපදාවක් ආවාම තමයි අපි ආයෙත් කථා කරන්නේ මේක කරන්න ඕනෑ, ඒක කරන්න ඕනෑ කියලා. ඒ නිසා මේ දෙපාර්තමේන්තුවයි, ඊට අදාළ ආයතනයි නවීකරණය කරන්න අවශ්‍ය පියවර ගැනීම කළ යුතුයි. ඒ වාගේම අපි අනෙක් පැත්තට කියනවා, මේ ගැන ක්‍රියා කරන්න ඕනෑ විධියට අදාළ පුද්ගලයින් දැනුවත් කරලා, ඔවුන්ට පුහුණුව ලබා දිය යුතුයි කියලා. ස්වාභාවික විපත් ඇති වන අවස්ථාවලදී ලෝකයේ වෙනත් රටවල ගන්නා ක්‍රියාමාර්ග ගැනීමට අපේ නිලධාරින් දැනුවත් කිරීමට, පුහුණු කිරීමට වගකීමකින් යුතුව පියවර ගත යුතුව තිබෙනවා.

අපි කියන අනෙක් කාරණය මෙයයි. අපේ අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය තවමත් දුර්වලයි. ස්වාභාවික විපත් විතරක් නොවෙයි, සුනාමි ව්‍යසනයෙන් පසුව මුළු ලෝකයම අනතුරු හැඟවීම් සඳහා විශේෂ වැඩ පිළිවෙළවල් යොදා ගෙන තිබෙනවා. විශේෂයෙන් අපට බලපාන පැසිපික් ආපදා මධ්‍යස්ථානය හරහා ලබා දෙන තොරතුරු විමර්ශනය කරන්නවත් උනන්දුවක් තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ.

ඒ නිසා අපි කියන්නේ, මෙවැනි අවස්ථාවලදී එකිනෙකාට - එහාට මෙහාට- චෝදනා කර කර ඉන්නේ නැතිව ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලායි. දැන් ඉතින් ඒක සිද්ධ වෙලා ඉවරයි. අනාගතය වෙනුවෙන් මේ සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයකට අවතීර්ණ විය යුතුයි කියන කාරණය පෙන්වා දෙමින් මේ සභාවේ අවධානය සඳහා මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා.

**[අ.භා. 2.45]**

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනවල ඇති වුණු ආපදා තත්ත්වයත් සමඟ සිද්ධ වුණු මහා ව්‍යසනය පිළිබඳව ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින් මේ විවාදයට සහභාගි වෙන්නට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

විශේෂයෙන්ම පසු ගිය දිනවල ඇති වුණු කුණාටුව නිසා ජීවිත 51කට වැඩි ප්‍රමාණයක් අහිමි වුණා වාගේම අතුරුදහන් වීම් ගණනාවකුත් සිද්ධ වුණා. අහිංසක පවුල්වලට නිවසේ ගෘහ මූලිකයින් අහිමි වුණා. සමහර තැන්වල ගෙදරට ප්‍රධාන ආදායම ලබා දෙන පුද්ගලයා ජීවිතක්ෂයට පත් වීම නිසා ඒ පවුල්වල ප්‍රධාන ආදායම් මාර්ගයත් නැති වුණා. අද වන විට විපතට පත් වුණු ධීවර පවුල් - [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
( தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ගයන්ත කරුණාතිලක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. GAYANTHA KARUNATILEKA *left the Chair and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද වන විට විපතට පත් වුණු ධීවර පවුල් විශාල ප්‍රමාණයක්, ධීවර යාත්‍රා ආම්පන්න රැසක් අහිමි වුණු බහුතර ජනතාවක් කර කියා ගන්න දෙයක් නොමැතිව අන්දමන්ද වෙලා ළතැවෙනවා. ඒ අයගේ ජන ජීවිත සහමුලින්ම නන්නත්තාර වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පිළිගන්නට ඕනෑ, සුළි සුළං, කුණාටු හෝ වෙනත් කාලගුණික දේශගුණික තත්ත්වයන් පිළිබඳව ආණ්ඩුවලට, විපක්ෂවලට දොස් පවරන්න බැහැ කියන එක. ඒවා ස්වභාවික ව්‍යසනයන්. එනමුත් අවදානම් තත්ත්වයන් පිළිබඳව ජනතාව නිසි ලෙස දැනුවත් කර, ජනතාවගේ ආරක්ෂාව සැපයීමේ ප්‍රධාන වගකීම රජය සතු වෙනවා.

විශේෂයෙන්ම මේ ව්‍යසනය තුළ, මේ විනාශය තුළ ජනතාව දැනුවත් නොකිරීමේ පූර්ණ වගකීම වර්තමාන රජය භාර ගත යුතුයි. ඒ වාගේම මේ ජීවිත රැසක් අහිමි වුණු මහා ව්‍යසනයකින් පසුවත් අපට දකින්නට ලැබෙන්නේ මොකක්ද? වග කිව යුතු මැතිඇමතිතුමන්ලා කුඩා දරුවන් හැසිරෙන ආකාරයට මහා විහිළුකාර ද්විත්ව රංගනයක් ක්‍රියාත්මක කරලා මුළු රටේම පුරවැසියන්ට ඒ විහිළුකාරී ද්විත්ව රංගනය නැරඹීමේ අවස්ථාව ලබා දුන්නා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මහා ව්‍යසනයෙන් පසුව ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත්, ආපදා කළමනාකරණ ඇමතිතුමාත් මොනවාද කියන්නේ? එක් කෙනකු කියනවා, මේ ගැන දැනුම් දුන්නා කියලා. අනෙක් එක්කෙනා කියනවා, දැනුම් දුන්නේ පරක්කු වෙලායි කියලා. තවත් අවස්ථාවක එක් කෙනෙක් කියනවා, හවස 4.00ට කිව්වා කියලා. එහෙම කිව්වාම තවත් පුද්ගලයෙක් කියනවා, දැනුම් දුන්නේ ඊළඟ දවසේ උදේ පාන්දරයි කියලා. ඉතින් මේ ද්විත්ව රංගනය, අනුන්ට බෝලය පාස් කරන රංගනය, තවත් කෙනකු මත වගකීම පැටවීමේ විහිළු සහගත නාට්‍ය ජනතාවට නරඹන්න අවස්ථාව ලබා දුන්නා. "මම නොවෙයි, ඒක කරන්න ඕනෑ එයා", "මේක කරන්න ඕනෑ මෙයා", "මම නොවෙයි, මේකට වග කියන්නේ, අපෝ! මට වගකීම භාර ගන්න බැහැ" යනාදී දේවල් කියමින් සත්‍ය වශයෙන්ම ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ රජයේ ඇමතිවරුන් රඟ දැක්වූ, නවතම රූකඩ සංදර්ශනය නරඹන්නට මුළු රටටම අවස්ථාව ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේක නිකම් ඉදිරිපත් කරන ප්‍රකාශයක් නොවෙයි. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු සරත් කුමාර ගුණරත්න මැතිතුමා සඳහන් කර තිබෙනවා, ඔය කියන fax එක ඒ වෙලාවේ ලැබී නැති බව ඔප්පු වුණා කියලා. එතකොට ගරු අමරවීර ඇමතිතුමා කියා තිබෙනවා, ධීවර අමාත්‍යාංශයට ඒ නිවේදනය වෙලාවට යවා තිබෙනවා කියලා. ආපසු සරත් කුමාර ගුණරත්න නියෝජ්‍ය ඇමතිතුමා කියා තිබෙනවා, ඒ අමාත්‍යාංශය මේ වරද භාර ගත යුතුයි කියලා. එතකොට අමරවීර ඇමතිතුමා කියා තිබෙනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව වගකීම නිසි ලෙස ඉටු කර තිබෙනවා කියලා. ආපසු සරත් කුමාර ගුණරත්න

මැතිතුමා කියා තිබෙනවා, දෙයක් වුණාට පස්සේ මෙහෙම දෙයක් වුණා කියන්න කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවක් අවශ්‍ය නැහැ කියලා. අමරවීර මැතිතුමා කියනවා, "මේ fax එක යවලා තිබෙන්නේ වෙනදා යවන නොම්මරවලටමයි. මම කියනවා, විශේෂ කමිටුවක් දමා CID එකටත් කියලා මේ ගැන සොයන්න" කියා. එතැනින් නතර වන්නේ නැහැ. ආපහු සරත් ගුණරත්න මැතිතුමා කියනවා, "කාලගුණ නිවේදන ජනමාධ්‍යයට දැනුම් දීම මගේ කාර්යයක් නොවෙයි" කියා. පෙරළා අපේ අමරවීර මැතිතුමා කියනවා, "කමිටුව, අපදා කළමනාකරණ අමාත්‍යාංශය වරදකරු කළොත් ඇමතිකමෙන් ඉල්ලා අස් වෙනවා" කියා. මෙන්න මේක තමයි මම සඳහන් කළ ද්විත්ව රූකඩ සංදර්ශනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මොකක්ද ඇත්ත කථාව? ඇත්ත කථාව මෙන්න මේකයි. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අසරණයි. කාලගුණ විද්‍යා දෙපාර්මේන්තුවේ බරපතළ භෞතික මානව සම්පත් ඌනතාවක් තිබෙනවා. ඒ ඌනතාවෙන් පෙළෙනවා. නියමාකාරව කාලගුණය පිළිබඳව අනාවැකි පළ කිරීම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට දුෂ්කර කාර්යයක්. බොරුවට නිලධාරින්ට බැණලා වැඩක් නැහැ. ප්‍රමාණවත් සම්පත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයටවත් නැහැ. අමාත්‍යාංශයට ක්‍රියාත්මක වන්න ඉඩක් නැහැ. ප්‍රතිපාදන නැහැ. සම්පත් නැහැ. ඇමතිතුමනි, අඩුම තරමේ පසු ගිය ගංවතුරෙන් විපතට පත් වුණු ජනතාවට තවම නිවාස ආධාර ටික දෙන්න බැරි ආශ්චර්යවත් යුගයකයි අපි ජීවත් වන්නේ. ආපදා කළමනාකරණ ඇමතිතුමා අසරණයි. පසු ගිය දවසක මම ආපදා කළමනාකරණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමට සහභාගි වුණු අවස්ථාවේ රජයේ මන්ත්‍රීවරු මැසිවිලි නැඟුවේ, "ගංවතුර ඇවිත් දැන් වසර ගණනාවක් වෙනවා. ඇයි, මේ විපතට පත් වුණු ජනතාවට නිවාස ආධාර ටික නොලැබෙන්නේ" කියායි. ඇත්ත වශයෙන්ම අපට දැන ගන්න ලැබුණා -[බාධා කිරීමක්]ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වැදගත් ඉදිරිපත් කිරීමක් කරන්නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
( குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised by the Hon. Alhaj A.H.M. Azwer.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Hon. Deputy Chairman of Committees, I have to bring to your kind notice the validity and the operation of the Standing Orders of Parliament, which should be strictly adhered to by the House. Sir, Standing Order No. 10 is about the Quorum, which states, I quote:

> "The quorum of Parliament required by Article 73 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka is twenty members including the person presiding. If at any time the attention of Mr. Speaker or other person presiding is directed to the fact that a quorum is not present he shall order the division bells to be rung and if at the expiration of five minutes a quorum be not present he shall adjourn Parliament without question put."

So, Sir, I raise, according to the Standing Orders, that there is no Quorum, which I am entitled to. Therefore, Sir, I am once again raising it when you are in the Chair, that you have to call for the Quorum and if the Quorum is formed, then you can continue with the Debate. If not, Standing Order No. 11 states, I quote:

> "........If a quorum be not then present Parliament shall adjourn as provided in the preceding Order but if a quorum be proved to be present Parliament shall forthwith resolve itself into Committee."

So, Sir, according to that, you have to call for the Quorum.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
( குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Yes, Hon. Lakshman Kiriella.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, when you raise the question of Quorum, nobody can argue about it.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
නැහැ, නැහැ, ඒ ගැන නොවෙයි. This is a very important Debate.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
( மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Nobody can debate that, Sir.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
Debate කිරීමක් නොවෙයි අසත්‍ය ප්‍රකාශ කරන විට කියන්න ඕනෑ. ඔබතුමා දැන් කිව්වා නේ. දැන් කී වතාවක් කිව්වාද වාඩි වෙන්න. තීන්දුවක් දෙයි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Lakshman Kiriella, what do you want to say?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි Parliamentary Business Committee එකේදී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කරන කොට සාමාන්‍යයෙන් Adjournment Motions සම්බන්ධයෙන් Quorum එකක් ඉල්ලන්නේ නැහැ කියලා ඇති කර ගත් එකඟතාවක් තිබෙනවා. මේක රටට බලපාන ප්‍රශ්නයක්නේ. [බාධා කිරීමක්]

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකක්ද මෙතුමා කියන්නේ? මන්ත්‍රීතුමා භයද? [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
භයද?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
According to the Standing Orders - [*Interruption*.]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
We have to follow the Standing Orders.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Yes, but sometimes, - [*Interruption.*] For example, during the Budget Debate -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, you cannot allow this. I have already raised my objection - [*Interruption.*]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Will you shut up,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
You shut up.

**ගරු තිස්ස අත්තනායක මහතා**
(மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க)
(The Hon. Tissa Attanayake)
මොකක්ද මේ කියන්නේ?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
You sit down. - [*Interruption.*]

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I am only asking you -

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
I have to act according to the Standing Orders.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Deputy Chairman of Committees, kindly listen to me. පොඩ්ඩක් මම කියන දේ අහන්න. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Right, I am calling for the Quorum.

***පාර්ලිමේන්තුව ගණන් කොට ගණපූරණයක් නොමැති වුයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.***

*பாராளுமன்றம் கணக்கிடப்பட்டு, கூட்ட நடப்பெண் இல்லையெனக் கண்டதனால், பிரிவு மணி அடிக்கப்பட வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Parliament counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

***පසුව ගණපූරණයක් නොතිබුණෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් 10 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 03.02ට, 2013 ජූලි මස 23වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*பின்னர் கூட்ட நடப்பெண் சேராததனால் குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் நிலைக் கட்டளை இல. 10இன்படி வினாவின்றிப் பாராளுமன்றத்தை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி, பி.ப. 3.02 க்கு, பாராளுமன்றம் 2013 யூலை 23, செவ்வாய்க்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Later, a Quorum not being present,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament, without Question put, under Standing Order No. 10.*

*Adjourned accordingly at 3.02 p.m. until 1.00 p.m.on Tuesday, 23rd July, 2013.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year. Late applications for subscriptions will not be accepted.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.